පරිච්ඡේදය 9

# ගිවිසුම් නීතිය
# CONTRACT LAW

කිසියම් පුද්ගලයෙක් සමාජයේ ජීවත් වීමේදී මෙන්ම ව්‍යාපාරයක් එහි අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කිරීමේදී බාහිර පුද්ගලයන්, ආයතන, සංවිධාන සමග නිරන්තර සබඳතා ඇතිකර ගැනීමට සිදුවේ. මෙම සබඳතා බොහෝ විට ගිවිසුම් මත ඇති වේ. ජස්ටිනියන් නැමති රෝම නීතිවේදියාට අනුව ගිවිසුම යනු, නීතියෙන් බලකරනු ලබන ප්‍රතිඥාවක් හෝ ප්‍රතිඥාවන් ගණනාවක් වේ.

සමස්ත වශයෙන් ගතහොත් ගිවිසුමක් යනු,

01. **නීත්‍යානුකූල අරමුණක්** ඉටුකරවා ගැනීම සඳහා
02. **ගිවිසුම් වලට එළඹීමේ හැකියාව ඇති පාර්ශවයන්** විසින්
03. **නීතිමය සබඳතාවක් ඇතිකර ගැනීමේ චේතනාවක්** මගින්
04. **ප්‍රතිෂ්ඨාවක්** මත පදනම්ව
05. පාර්ශවකරුවන් අතර ඇති වන්නා වූ **නියම එකඟතාවකි.**

### ගිවිසුමක් ඇති වන ආකාර

දෙපාර්ශවයක් අතර නෛතික බැඳීම් චේතනාවක් සහිතව ඇතිවන ගිවිසුම **ලිඛිතව හෝ වාචිකව හෝ ව්‍යංගයෙන්** හට ගනී. මෙහිදී එක් පාර්ශවයක් විසින් කරනු ලබන යෝජනාවක් හෙවත් අර්පණයක් (Offer) අනෙක් පාර්ශවයක් විසින් පිළිගත යුතුය / ප්‍රතිග්‍රහණය (Acceptance) කළ යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| **අර්පණය** | + | **ප්‍රතිග්‍රහණය** | = | **වලංගු ගිවිසුම** |
| **(Offer)** | + | **(Acceptance)** | | |

### ක්‍රියාත්මක කළ හැකි ගිවිසුම (Enforseable Contracts)

යම් ගිවිසුමක් ඇතිකර ගන්නා පාර්ශවයන් අතර එම ගිවිසුමට අදාළ කිසියම් ආරවුලක් / ප්‍රශ්නයක් ඇති වූ විටදී අහිංසක පාර්ශවකරුට අධිකරණයකට ගොස් එම ගිවිසුමට අදාළව කිසියම් ප්‍රතිකර්මයක් නැතහොත් සහනයක් අධිකරණයෙන් ලබාගත හැකි ගිවිසුමක් ක්‍රියාත්මක කළ හැකි ගිවිසුමක් වේ.

### ක්‍රියාත්මක කළ නොහැකි ගිවිසුම (Unenforseable Contract)

යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් හෝ ආරවුලක් ඇති වූ විට අහිංසක පාර්ශවකරුට අධිකරණය වෙත ගොස් එම අධිකරණයෙන් සහනයක් ලබාගත නොහැකි නම්, එය ක්‍රියාත්මක කළ නොහැකි ගිවිසුමක් වේ.

### ක්‍රියාත්මක කළ හැකි වලංගු ගිවිසුමක් හටගැනීම සඳහා තිබිය යුතු මූලිකාංග

01. අර්පණයක් තිබිය යුතුය. (Offer)
02. ප්‍රතිග්‍රහණයක් තිබිය යුතුය. (Acceptance)
03. සාධාරණ හේතුවක් තිබිය යුතුය. (Moral Obligation / Justice Causa)
04. ප්‍රතිෂ්ඨාවක් තිබිය යුතුය. (Consideration)
05. ගිවිසුමේ අරමුණ නීත්‍යානුකූල විය යුතුය.
06. ගිවිසුමට සම්බන්ධ පාර්ශවයන්ට ගිවිසුම් ශක්නුතාවක් (Legal Capacity) (හැකියාව) තිබිය යුතුය.
07. නියම කැමැත්තක් තිබිය යුතුය. (Genuine Concept)

# අර්පණය

තවකෙකු සමග ගිවිසුමකට ඇතුලත් වීමේ අදහසින් එක් අයකු විසින් තවකෙකු වෙත කරනු ලබන යෝජනාවක් අර්පණයක් ලෙස සැලකිය හැකිය.

ගිවිසුම් නීතියේ අර්පණයක් ලෙස හඳුන්වන්නේ, යමෙකු වෙත යොමු කරනු ලබයි ද, ඔහු එය පිළිගත් වහාම ඉන් බැඳේ යයි සිතුවිල්ලෙන් යුතුව එක් අයකු විසින් තවකෙකු වෙත කරන යෝජනාවකි. මේ අනුව අර්පණය පොරොන්දුවක් ලෙසද සැලකිය හැකිය. එය ලිඛිතව හෝ වාචිකව හෝ ව්‍යංගයෙන් හෝ ද සිදුකළ හැකිය.

උදා: **සමන් සිය මෝටර් රථය රු. 250,000 විකිණීමට යෝජනාවක් කිරීම.**

අර්පණය කරන තැනැත්තා **අර්පනදායි** (Offeror) ලෙසද, එම අර්පණය කරනු ලබන්නේ යමෙකු වෙතද එම තැනැත්තා **අර්පනලාභි** (Offeree) ලෙස හැඳින්වේ.

අර්පණය කරනු ලැබුවේ යම් නිශ්චිත පුද්ගලයකු වෙත නම්, එය ප්‍රතිග්‍රහනය කළ හැක්කේද, එකී නිශ්චිත පුද්ගලයාට පමණි. එහෙත් අදාළ අර්පණය සිදු කර ඇත්තේ, **සමස්ත ලෝකයා** වෙත නම්, එය ප්‍රතිග්‍රහනය කිරීම **මහජනයා අතුරින් ඕනෑම අයකුට** සිදු කළ හැකිය.

අදාළ අර්පණය සිදුකර ඇත්තේ **යම් පුද්ගල කණ්ඩායමක්** වෙත නම්, එම **කණ්ඩායමේ සාමාජිකත්වය** දරන ඕනෑම අයකුට එය ප්‍රතිග්‍රහනය කළ හැකිය.

ඉහත කී පරිදි යම් අර්පණයක් සමස්ත ලෝකයා වෙත කර ඇති විටදී ලොව සිටින ඕනෑම අයකුට එම අර්පණය ප්‍රතිග්‍රහනය කළ හැකි බව පළමුවෙන්ම පිළිගනු ලැබුවේ **Carlill Vs Carbolic Smokeball Co. (1893)** නඩුවේදීය. මෙහිදී විත්තිකාර සමාගම විසින් සෙම්ප්‍රතිශ්‍යාව සඳහා ඖෂධයක් නිපදවා ඒ සම්බන්ධ පුවත්පත් දැන්වීමක් පල කරන ලදී. එම දැන්වීමේ සඳහන් වුයේ "මෙම ඖෂධය පානය කරන්නෙකුට එම රෝගය නැවත නොවැළඳෙන බවත්, යම් අයුරකින් එය පානය කළ අයකුට සෙම්ප්‍රතිශ්‍යාව වැළඳුනහොත් පවුම් 100 ක තෑගි මුදලක් පිරිනමන බවත්ය. මේ ත්‍යාග මුදල පිරිනැමීම සඳහා පවුම් 1000 ක මුදලක් බැංකුවේ තැන්පත් කර තිබුණි. සෙම්ප්‍රතිශ්‍යා රෝගයෙන් පෙලුන Carlill නැමැති වයස්ගත කාන්තාව එම ඖෂධය මිලදී ගෙන එහි විස්තර පත්‍රයේ සඳහන් අයුරින් ඉතාමත් නිවැරදිව මෙම ඖෂධය භාවිතා කළ ද ඇයට නැවතත් එම රෝගය වැළඳුන නිසා තෑගි මුදල් සමාගමෙන් ඉල්ලා සිටින ලදී. සමාගම එය ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී. මෙහිදී ඇය සමාගමට එරෙහිව නඩු පැවරුවාය. අධිකරණය තීරණය කළේ සමාගම ඉහත කී අර්පණය සමස්ත ලෝකයා වෙතම ඉදිරිපත් කළ එකක් බැවින් Carlill නැමති කාන්තාව පමණක් නොව එකී ඖෂධය භාවිතයෙන් පසුව නැවත රෝගී තත්ත්වයට පත් වු ඕනෑම අයකුට එම තෑගි මුදල් සඳහා හිමිකමක් ඇති බවයි. ඊට හේතුව පැමිණිලිකාරිය සහ විත්තිකාර සමාගම අතර වලංගු ගිවිසුමක් හටගෙන ඇති බැවිනි.

**අර්පණය සන්නිවේදනය කිරීම (Communication of an Offer)**

අර්පණය කිරීමෙන් වලංගු ගිවිසුමක් ඇති වීමට නම්, එකී අර්පණය ප්‍රතිග්‍රහණය කරන මොහොත වන විට එම අර්පණය ක්‍රියාකාරිත්වයට පත්ව තිබුනා විය යුතුය. එනම්, අර්පණය ප්‍රතිග්‍රහනය කරන මොහොතේදී එම අර්පණය අර්පණලාභියාට සන්නිවේදනය වී තිබුණා විය යුතුය. එනම් අර්පණලාභියා අර්පණය ප්‍රතිග්‍රහනය කරන මොහොතේදී තමාවෙත අර්පණදායි විසින් අර්පණයක් කර තිබූ බව අර්පණලාභියා දැන සිටියා විය යුතුය.

උදා: A තමාගේ නැති වු රන් මුදුව සොයා ගෙනවිත් දෙන අයකුට රු. 1,000 ක ත්‍යාගයක් දෙන බව ප්‍රකාශ කරයි. A ගේ මිතුරකු වන B එම රන් මුදුව සොයාගෙන A ට භාරදීමට එන මොහොතේදී A විසින් කර ඇති අර්පණය ගැන දැන ගනී. මෙම තත්ත්වය යටතේ දෙදෙනා අතර වලංගු ගිවිසුමක් ඇති වි යැයි කිව නොහැකිය. ඊට හේතුව A විසින් කරන ලද අර්පණය B විසින් ප්‍රතිග්‍රහනය කරන ලද මොහොත හෙවත් රන් මුදුව අහුලාගත් මොහොත වන විට A ගේ අර්පණය B වෙත සන්නිවේදනය වී නොතිබුණ බැවිනි.

**Bloom Vs American Swiss Watch Co.** නඩුවේදී සොරකම් කරන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු සපයන්නෙකුට ත්‍යාගයක් පිරිනමන බවට සමාගම විසින් කරනු ලැබූ අර්පණය පිළිබඳ නොදන පැමිණිලිකරු තොරතුරක් ලබාදී තිබුණි. ඒ අනුව අර්පණය ප්‍රතිග්‍රහනයට පෙර සන්නිවේදනය නොවූ බැවින් පැමිණිලිකරුට එම තෑගි මුදලක් සඳහා හිමිකමක් නොමැති බවට අධිකරණය තීරණය කළේය.

**අර්පණයක් කිරීමට ආරාධනා කිරීම (An Invitation to Offer / An Invitation to Treat)**

ගිවිසුමකට එළඹෙන සමහර පාර්ශවයන් ඍජුවම අර්පණයක් කිරීම නොකරන අතර ඊට ප්‍රථම කරන කටයුත්තක් ලෙස මෙම අර්පණයට ආරාධනා කිරීම දැක්විය හැක. එනම් අනාගතයේදී වලංගු ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා පූර්ව සාකච්ඡාවක් ආරම්භ කරන ලෙස එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවයට කරනු ලබන පොදු ඉල්ලීමක් ලෙස මෙය හැඳින්විය හැකිය.

අර්පණයක් සහ අර්පණය කිරීමට කරන ආරාධනයක් අතර දැකිය හැකි ප්‍රධානතම වෙනස වන්නේ අර්පණයක් ප්‍රතිග්‍රහනය කිරීමෙන් වලංගු ගිවිසුමක් ඇති වුවත්, **අර්පණයක් කිරීමට කරනු ලබන ආරාධනයක් ප්‍රතිග්‍රහ කිරීමෙන් ගිවිසුමක් ඇති නොවන බවයි.**

**අර්පණයක් කිරීමට ආරාධනා කරන අවස්ථා**

**01. සාප්පුවක ප්‍රදර්ශන කවුළුවේ මිල නියම කළ භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම.**

උදා: Fisher Vs Bell (1961) නඩුවේදී විත්තිකරු නීතියෙක් තහනම් කර ඇති පිහි වර්ග විකිණීම සඳහා තම සාප්පුවේ ප්‍රදර්ශන කවුළුවේ විකුණන මිල සඳහන් කරමින් ප්‍රදර්ශනය කළේය. එවකට පැවති නීතිය අනුව මෙම වර්ගයේ පිහි විකිණීමට අර්පණය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව මෙම නීතියෙන් ප්‍රකාශ විය. විත්තිකරු මෙම නීතිය කඩ කළේ යන පදනම යටතේ ඔහුට විරුද්ධව ගොනු කළ නඩුවකදී අධිකරණය තීරණය කළේ විත්තිකරු සිදුකර තිබුනේ එකී විකිණීම සඳහා අර්පණය කිරීමට ආරාධනා කිරීමක් පමණක් වන බැවින් ඔහු මෙම නීතිය කඩකළේ යැයි නිගමනය කළ නොහැකි වන බවයි.

**02. ස්වයං සේවා වෙළඳ සැලක මිල නියම කළ භාණ්ඩ රාක්ක මත තබා තිබීම.**

උදා: Pharmaceutical Society Great Britain Vs Boots Cash Chemists (1952) නඩුවේදී යම් විෂ සහිත ඖෂධ වර්ගයක් සුදුසුකම්ලත් ඖෂධවේදියකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ අලෙවිකළ යුතු බවට පැවති නීතියක් ප්‍රශ්නගත විය. මෙහිදී විත්තිකාර ආයතනය මෙම ඖෂධ විකිණීම සඳහා තම ස්වයං සේවා වෙළඳසැලට රාක්ක මත තබා තිබූ අතර ඒ අවට සුදුසුකම්ලත් ඖෂධවේදීන් නොවීය. මේ නිසා විත්තිකාර ආයතනය විසින් එම නීතිය කඩකළේ යන පදනම යටතේ ඔහුට විරුද්ධව පවරන ලද නඩුවේදී අධිකරණය ප්‍රකාශ කළේ මිල ලකුණු කළ භාණ්ඩ ස්වයං සේවා වෙළඳසැලේ රාක්ක මත තබා තිබීම අර්පණය කිරීම සඳහා කරනු ලබන ආරාධනා කිරීමක් පමණක් හෙයින් ඉහත කී නීතිය විත්තිකාර ආයතනය විසින් උල්ලංඝනය කර නොකර ඇති බවයි. එසේම සත්‍ය වශයෙන්ම ඖෂධ විකිණීම කරන්නේ මුදල් ගෙවන කවුළුව ළඟ නිසා එම ස්ථානයේ සුදුසුකම්ලත් ඖෂධවේදියකු සිටි නිසාත් මෙම නීතිය Boots Cash Chemists ආයතනය විසින් කඩනොකරන ලද බව අධිකරණය තීරණය කළේය.

**03. එක් ව්‍යාතිරේඛයකට යටත්ව පුවත්පතක හෝ සඟරාදියෙහි දැන්වීම් පල කිරීම**

උදා: Harris Vs Nickerson (1873) නඩුවේදී ලන්ඩනයේ යම් නිශ්චිත දිනයක හා ස්ථානයක නියමිත වේලාවක පැරණි ලී බඩු වෙන්දේසියක් පවත්වන බවට පුවත්පතක පළකර තිබූ දැන්වීමක් අනුව ඊට සහභාගී වීමට ගිය පුද්ගලයකුට දැක ගතහැකි වූයේ පැරණි ලී බඩු

සියල්ලම වෙන්දේසියෙන් ඉවත් කර තිබූ බවයි. වෙන්දේසියට යාමෙන් වැය වූ කාලය සහ වියදම් සඳහා වන්දි ඉල්ලා එම තැනැත්තා විසින් පවරනු ලැබූ නඩුවේදී මෙසේ දැන්වීමක් පළ කිරීම අර්පණයට කරන ආරාධනයක් වන නිසා වන්දි ලබාගත නොහැකි බව අධිකරණය තීරණය කළේය.

**04.** **සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ සී/ස සමාගමක කොටස් මහජනයා වෙත අලෙවි කිරීම සඳහා නිකුත් කරනු ලබන සංස්ථා ප්‍රකාශය (Prospectus) හා ඒ සමග නිකුත් කරන හිස් අයදුම්පත්‍රය සැලකෙන්නේ අර්පණයක් කිරීමට කරනු ලබනන ආරාධනයක් ලෙසයි.**

**05.** **වෙන්දේසියක් මගින් භාණ්ඩ අලෙවි කරනු ලබන බවට පළ කරනු ලබන දැන්වීමක් ද අර්පණයක් කිරීමට කරනු ලබන ආරාධනයක් සේ සැලකේ.**
කෙනෙකු වෙන්දේසියට සහභාගී වී මිල ගණන් කියමින්, ලංසු තබමින් භාණ්ඩ ඉල්ලුම් කිරීම අර්පණයක් වන අතර වෙන්දේසිකරු එම මිලට භාණ්ඩ දීමට තීරණය කිරීම ප්‍රතිග්‍රහණය කිරීමක් වේ.

**06.** **ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා වන ආරාධනය ද අර්පණයක් කිරීම සඳහා වන ආරාධනයක් ලෙස සැලකේ.**

**අර්පනය අවසන් වීම (Termination of an Offer)**

**අවසන් වන අවස්ථා:-**

(i) කාලය අවසන් වීම (by lapse of time)
(ii) අර්පණය ඉල්ලා අස්කර ගැනීම (Revocation of an offer)
(iii) අර්පණය ප්‍රතික්ෂේප කිරීම (Rejection of an offer)
(iv) අර්පණදායිගේ හෝ අර්පණලාභිගේ මරණය (by death of an offeror or offeree)
(v) අර්පණය පිළිගත යුතු ආකාරය නියම කර ඇති විට ඒ අනුව පිළිගැනීම සිදු නොකිරීම.
(vi) ව්‍යාර්තවීමෙන් (Frustration)
(vii) ප්‍රතිග්‍රහණයෙන් (Acceptance)

## ප්‍රතිග්‍රහණය - ACCEPTANCE

අර්පණදායී විසින් කරනු ලැබූ යෝජනාව අර්පණලාභියා විසින් පිළිගැනීම ප්‍රතිග්‍රහණය ලෙස හැඳින්වේ. මෙය ක්‍රම 03 කට සිදුවේ.

1. ලිඛිතව
2. වාචිකව
3. ව්‍යාංගයෙන්

**ප්‍රතිග්‍රහනයට අදාල මූලධර්ම**

1) අර්පණය, අර්පණය ඉල්ලා අස්කර ගැනීම මෙන්ම ප්‍රතිග්‍රහණයද වලංගු තත්ත්වයට පත්වූවා ලෙස සලකනු ලබන්නේ, ප්‍රතිග්‍රහණය අර්පණදායි වෙත සන්නිවේදනය වූ විට දීය.

2) ප්‍රතිග්‍රහණය සන්නිවේදනය විය යුත්තේ බලය තිබෙන ආකාරයෙන් හෙවත් නිල වශයෙනි. එනම් නිල නොවන ආකාරයට ප්‍රතිග්‍රහණය සන්නිවේදනය වී ඇති විටදී එම ප්‍රතිග්‍රහණය වලංගු නොවේ.

උදා: **<u>Powel Vs Lee</u>**
සම්මුඛ පරීක්ෂණයක් සඳහා සහභාගී වූ අයෙකුව අදාල තනතුරු සඳහා තෝරාගෙන ඇති බව බලය නොමැති අධ්‍යක්ෂකවරයෙකු මාර්ගයෙන් වාචිකව දැන ගැනීමට ලැබුණි.

ඒ අනුව ඔහු එතෙක් කරමින් සිටි රැකියාවෙන් ඉවත් වන ලදී. නමුත් අදාල සමාගම වෙනත් අයෙකුව එම තනතුරට පත්කර ගන්නා ලදී. මෙම තත්ත්වය යටතේ තමාට සිදුවූ අලාභ අයකර ගැනීමට සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ අය විසින් එකී සමාගමට එරෙහිව නඩු පවරන ලදී.

මෙහිදී අධිකරණය තීරණය කරනු ලැබුවේ.

i. යමෙකු සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම අර්පණයක් වේ.
ii. සම්මුඛ පරීක්ෂණයේදී තනතුර සඳහා යමෙකු තෝරා ගැනීම ප්‍රතිග්‍රහණය වේ.
iii. ප්‍රතිග්‍රහණය වලංගු තත්ත්වයට පත්වීම සඳහා එය අර්පණලාභී වෙත නිල වශයෙන් සන්නිවේදනය විය යුතුය.
iv. නමුත් මෙහි ප්‍රතිග්‍රහණය නිල නොවන ආකාරයට සන්නිවේදනය වී ඇති බැවින් වලංගු ප්‍රතිග්‍රහණයක් නැත. එබැවින් පාර්ශවකරුවන් අතර වලංගු ගිවිසුමක් හට නොගනී.

3) B ප්‍රතිග්‍රහණය සඳහා සක්‍රිය ක්‍රියාවක් පැවතිය යුතුය. එනම් අර්පණලාභිගේ නිහඬතාවය ප්‍රතිග්‍රණයක් ලෙස සැලකිය නොහැක.

උදා: **<u>Felthouse Vs Bindley</u>**

මෙම නඩුවේදී A විසින් B වෙත ලිපියක් යවමින් දැනුම් දී තිබුනේ B ගේ අශ්වයාව A මිලදී ගැනීමට කැමති බවත්, ඒ පිළිබඳව වැඩි යමක් දැනගනීමට නොලැබුනහොත් අශ්වයා තමාට අයත් බවට සලකන බවත්ය. අශ්වයාව A ට විකිණීමට B අදහස් කළ නමුත් අදාල ප්‍රතිග්‍රහණය A වෙත සන්නිවේදනය කිරීමට B ට නොහැකි විය.

මේ අතරතුර B ගේ නියෝජිතයා විසින් අශ්වයාව වෙනත් අයෙකුට විකිණීම හේතුවෙන් A ට සිදු වූ අලාභ අයකර ගැනීමට B ට එරෙහිව නඩු පවරන ලදී.

මෙහිදී අධිකරණය තීරණය කරනු ලැබුවේ,

i. B ගේ නිහඬතාවය ප්‍රතිග්‍රහණයක් ලෙස සැලකිය නොහැක.
ii. එසේම අදාල ප්‍රතිග්‍රහණය A වෙත සන්නිවේදනය වී නොමැත.
iii. එමනිසා A හා B අතර වලංගු ගිවිසුමක් හටගෙන නොමැත.
iv. A ට අලාභ ඉල්ලා සිටිය නොහැක.

4) <u>ප්‍රතිග්‍රහණය සන්නිවේදනය විය යුතුය යන මූලධර්මයට ඇති ව්‍යාතිරේඛ</u>

ප්‍රතිග්‍රහණය සන්නිවේදනය විය යුතුය යන රීතියට අදාලව ව්‍යාතිරේඛී අවස්ථා 2 ක් ඇත. මෙම ව්‍යාතිරේඛි අවස්ථා වලදී ප්‍රතිග්‍රහණය අර්පණදායි වෙත සන්නිවේදනය **<u>නොවුවද</u>** පාර්ශවකරුවන් අතර **<u>වලංගු ගිවිසුමක් හටගනී.</u>**

1. **ශීඝ්‍ර තැපැල් න්‍යාය (Expedition Theory)**

එනම් ප්‍රතිග්‍රහණය තැපැල් මගින් දැනුම් දීමට පාර්ශවකරුවන් එකඟව ඇත්නම් (මෙම එකඟතාව ප්‍රකාශිත හෝ වටහාගත හැකි එකඟතාවක් විය හැක) අර්පණලාභී විසින් ප්‍රතිග්‍රහණ ලිපිය නිසියාකාරව තැපැලට බාරදුන් මොහොතේ පටන්, ප්‍රතිග්‍රහණය වලංගු තත්ත්වයට පත්ව පාර්ශවකරුවන් අතර වලංගු ගිවිසුමක් ඇති වූ බවට සැලකේ.

**උදා:** A විසින් තම මෝටර් රථය රු. 100,000/- කට විකිණීමට කැමති බවත් එය මිලදී ගන්නේ නම් දින 4 ක් ඇතුලත තැපැල් මගින් දැනුම්දෙන ලෙසත් B ට දන්වා යවයි.

මෙහි ප්‍රතිග්‍රහණය තැපැල් මගින් විය යුතු බවට පාර්ශවකරුවන් ප්‍රකාශිතව එකඟ වී ඇත. මෙවැනි අවස්ථාවකදී ප්‍රතිග්‍රහණ ලිපිය තැපෑලේදී අස්ථානගත වුවද, ප්‍රමාද වුවද එහි බලපෑමක් නැත.

ප්‍රතිග්‍රහණ ලිපිය තැපැල් කළ මොහොතේ පටන් පාර්ශවකරුවන් අතර ප්‍රතිග්‍රහණය වලංගු තත්ත්වයට පත්ව වලංගු ගිවිසුමක් ඇති වුවා ලෙස සලකනු ලබයි.

2. **ඒකපාර්ශවීය ගිවිසුම් (Unilateral Contracts)**

එනම් අර්පණදායි විසින් තම අර්පණයෙන් බලාපොරොත්තු වන්නේ අර්පණලාභී යම් ක්‍රියාවක් සිදුකිරීමක් පමණක් නම් එවැනි ගිවිසුම් මෙලෙස හැඳින්වේ, එවැනි අවස්ථාවක අර්පණලාභී විසින් එම ක්‍රියාකාරකම සිදුකිරීමට පටන්ගත් **<u>මොහොතේදී ප්‍රතිග්‍රහණය වලංගු තත්ත්වයට පත්වුවා ලෙස සලකනු ලබයි.</u>**

**උදා:** Carlill නඩුවේ

## සාධාරණ හේතුව - JUSTA CAUSA

ඉංග්‍රිසි නීතිය අනුව යම් ගිවිසුමක් වලංගු තත්ත්වයට පත්වීම සඳහා එයට අගනා ප්‍රතිෂ්ඨාවක් පැවතිය යුතය. (Valuable Consideration)

රෝම ලන්දේසි නීතිය අනුව යම් ගිවිසුමක් වලංගු වීම සඳහා එයට සාධාරණ හේතුවක් පැවතිය යුතුය. (Justa Cause)

රෝම ලන්දේසි නීතිය පිළිගත් සාධාරණ හේතුව යන්නට ඉංග්‍රිසි නීතිය පිළිගත් අගනා ප්‍රතිෂ්ඨාව යන්නත් සදාචාරාත්මක බැඳීම (Moral Obligation) යන්නත් ඇතුලත් වේ.

## අගනා ප්‍රතිෂ්ඨාව

පොරොන්දුදායිගේ පොරොන්දුවක් හේතුවෙන්, පොරොන්දුදායි, පොරොන්දුලාභිගෙන් ලබන වාසිය හෝ පොරොන්දුදායිට එවැනි වාසියක් නොමැති නමුත් පොරොන්දුලාභියා තමාව වඩා අගතිදායි තත්ත්වයට පත්කර ගැනීම අගනා ප්‍රතිෂ්ඨාව නම් වේ.

**උදා:** A විසින් මෝටර් රථය මාසයක කාලයක් සඳහා පාවිච්චි කිරීමට B ට ලබාදීමට පෙරොන්දු වේ. එම පොරොන්දුව හේතුවෙන් B විසින් A ට රු. 10,000 ක මුදලක් ලබාදේ. A ගේ මෙම පොරොන්දුව හේතුවෙන් B ගෙන් ප්‍රතිලාභයක් A විසින් ලබා ඇත. A ගේ පොරොන්දුවට අගනා ප්‍රතිෂ්ඨාවක් ඇත.

ඉහත කී නිදර්ශනයේ B විසින් A ට රු. 10,000 ක මුදල ලබාදීම වෙනුවට B විසින් එම මුදල රෝහලකට පරිත්‍යාග කරයි නම්,

A තම පොරොන්දුව හේතුවෙන් B ගෙන් ප්‍රතිලාභයක් ලබා නොමැති නමුත්, B තමාව වඩා අගතිදායි තත්ත්වයකට පත්කර ගෙන ඇත. (අගතිදායි තත්ත්වයට පත්කර ගැනීමට අදාල නිදර්ශන ලෙස, යම් වියදමක් දැරීම, රෝගයක් බෝකර ගැනීම, යම් වෙහෙසකර කටයුත්තක් කිරීම, අභියෝගයක් භාර ගැනීම ආදිය දැක්විය හැක.) එම නිසා A ගේ පොරොන්දුවට අගනා ප්‍රතිෂ්ඨාවක් ඇත.

ප්‍රතිෂ්ඨාව යන්න කොටස් 3 කට බෙදා දැක්විය හැක.

1. ඉටුකළ යුතු ප්‍රතිෂ්ඨාව - Executory
2. ඉටු කළ ප්‍රතිෂ්ඨාව - Executed
3. අතීත ප්‍රතිෂ්ඨාව - Past

ගිවිසුම් නීතිය අනුව වලංගු ගිවිසුමක් බිහිවීමට ඉටුකළ යුතු හා ඉටුකල ප්‍රතිෂ්ඨාවක් පැවතීම ප්‍රමාණවත් වේ. නමුත් අතීත ප්‍රතිෂ්ඨාව වලංගු ප්‍රතිෂ්ඨාවක් ලෙස ගිවිසුම් නීතිය පිළිනොගනී.

### ඉටු කළ යුතු ප්‍රතිෂ්ඨාව – Executory Consideration

මෙහිදී ගිවිසුමේ පාර්ශවකරුවන් එම ගිවිසුම යටතේ ඉටු කලයුතු කාර්යයන් අනාගතයේදී සිදු කල යුතුව පවතී.

**උදා:** A තම මෝටර් රථය විකිණීමටත් ඒ වෙනුවට B විසින් රු. 100,000 A ට ගෙවීමටත් පොරොන්දු වේ. මෙහි රථය විකිණීම හා මුදල ගෙවීම යන සිද්ධීන් දෙකම අනාගතයේදී සිදුවේ. එම නිසා මෙය ඉටුකල යුතු ප්‍රතිෂ්ඨාවකි.

### ඉට කළ ප්‍රතිෂ්ඨාව

මෙහිදී ගිවිසුමේ එක් පාර්ශවයක් විසින් එම ගිවිසුම යටතේ ඉටුකල යුතු කාර්ය ඉටුකර අවසන් වන අතර ගිවිසුමේ අනෙක් පාර්ශවය විසින් ඉටුකල යුතු කාර්ය අනාගතයේදී ඉටුකල යුතුව පවතී.

උදා: A විසින් B ට රු. 100,000 ක මුදලක් ලබාදී B සතු මෝටර් රථය A ට විකුණන ලෙස B ගෙන් ඉල්ලා සිටී.

මෙහි A ගේ කාර්ය ඉටුකර අවසන්ය. නමුත් B විසින් ඉටුකල යුතු කාර්ය ඉටුකල යුතුව ඇත.

**අතීත ප්‍රතිඡ්ඨාව**

මෙහිදී යම් නිශ්චිත ගණුදෙනුවක් අතීතයේ දී සම්පූර්ණයෙන්ම සිදුවී අවසන් වීමෙන් පසුව ඒ මත පදනම්ව ගිවිසුමට එලඹීම සිදුවේ සිදුවේ.

උදා: කාලයකට ඉහත දී A නිවසක් අළුත්වැඩියා කරයි. පසුව A විසින් සිදුකල අළුත්වැඩියාව සඳහා මුදල් ගෙවීමට B ගිවිසුමක් අද දින අත්සන් කරයි. මෙහි ප්‍රතිෂ්ඨාව අතීත ප්‍රතිෂ්ඨාවක් බැවින් ගිවිසුම වලංගු නොවේ.

## සාදාචාරාත්මක බැදීම - MORAL OBLIGATION

යම් ගිවිසුමකට ඇතුලත් වීමට යමෙකු වෙත සදාචාරාත්මක බැදීමක් ඇත්නම් එවිට එම ගිවිසුමට සාධාරණ හේතුවක් ඇතැයි කිව හැක.

උදා: තම ස්වභාවික ආදරය මත දරුවෙකුට දෙනු ලබන ත්‍යාගයක් වේනම් එයට සදාචාරාත්මක බැදීමක් ඇති බැවින් එයට සාධාරණ හේතුවක් ඇත.

**නෛතික සම්බන්ධතා ඇතිකර ගැනීම සඳහා වූ බරපතල චේතනාව**

පාර්ශවකරුවන් අතර වලංගු ගිවිසුමක් ඇතිවීම සඳහා ඔවුන් එම ගිවිසුමට ඇතුලත් වන මොහොතේදී නෛතික සම්බන්ධතා අතිකර ගැනීම සඳහා බරපතල වූ චේතනාවක් තිබිය යුතුය.

එනම් ගිවිසුමේ යම් පාර්ශවයක් එම ගිවිසුම කඩ කළහොත් අනෙක් පාර්ශවයට අධිකරණය වෙත ගොස් යම්කිසි සහනයක් ලබා ගැනීමට චේතනාවක් ගිවිසුමට ඇතුලත් වන මොහොතේ තිබිය යුතුය.

පාර්ශවකරුවන් අතර බරපතල වූ චේතනාවක් ගිවිසුමකට ඇතුලත් වන අවස්ථාවේ පවතියේද නැද්ද යන්න තීරණය කිරීම සඳහා ගිවිසුම කොටස් 2 කට බෙදා සලකා බැලිය යුතුයි.

1. ගෘහස්ථ ගිවිසුම - Domestic Contracts
2. වාණිජ්‍යමය ගිවිසුම - Commercial Contracts

**1. ගෘහස්ථ ගිවිසුම – Domestic Contracts**

**ගෘහස්ථ ගිවිසුම් යනු**

.............................................................................................................................................

.............................................................................................................................................

මෙවැනි ගිවිසුම වලට අදාලව යෙදෙන පූර්ව නිගමනය වන්නේ පාර්ශවකරුවන් අතර නෛතික සම්බන්ධතා ඇතිකර ගැනීම සඳහා වූ බරපතල චේතනාවක් නොමැති බවයි.

කෙසේ නමුත් මෙම පූර්ව නිගමනය බිඳහෙලිය හැකි පූර්ව නිගමනයකි. එනම් අදාල පූර්ව නිගමනය නොයෙදෙන බවට යම් පාර්ශවයක් සාක්ෂි මගින් අධිකරණය සෑහීමකට පත් කරයි නම් එවිට එකී පූර්ව නිගමනය බිඳ වැටි පාර්ශවකරුවන් අතර වලංගු ගිවිසුමක් හට ගැනීමට අවශ්‍ය එකී 4 වන අංගය (බරපතල චේතනාව) ස්ථාපනය වේ.

උදා: **<u>Balfour Vs Balfour</u>**
ඉංග්‍රිසි ජාතික යුවලක් තම නිවාඩුව ගත කිරීමට එංගලන්තයට ගිය අතර එහිදී බිරිඳ අසනීප වීම නිසා ඇය එහි නවතා ස්වාමියා රැකියාව වෙත පැමිණෙන ලදී.
ස්වාමි පුරුෂයා එසේ පැමිණෙන විට මසකට පවුම 30 ක් බිරිඳට ගෙවීමට එකඟ වුවද ඔහු එම මුදල ගෙවීම පැහැර හරින ලදී.

එම තත්ත්වය යටතේ බිරිඳට සිදු වූ අලාභය අයකර ගැනීමට ස්වාමි පුරුෂයාට නඩු පවරන ලදී. මෙහිදී අධිකරණය විසින් තීරණය කරන ලැබුවේ.

i. මෙය ගෘහස්ථ ගිවිසුමක් බවත් ගෘහස්ථ ගිවිසුම් වලට අදාලව යෙදෙන පූර්ණ නිගමනය වන්නේ පාර්ශවකරුවන් අතර බරපතල චේතනාවන් නොපවතින බවටය.
ii. පාර්ශවකරුවන් ගිවිසුමට ඇතුලත් වීම සලකා බැලීමේදී එකී පූර්ව නිගමනය බිඳහෙලීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැත.
iii. එම නිසා මෙම ගිවිසුමට එකී පූර්ව නිගමනය යෙදෙන බැවින් ඔවුන් අතර වලංගු ගිවිසුමක් හට නොගනී.
iv. බිරිඳට අලාභ ඉල්ලා සිටිය නොහැක.

උදා: **<u>Merrit Vs Merrit</u>**

ස්වාමි පුරුෂයා හා බිරිඳට අයත්ව තිබූ නිවස උකස් කර තිබූ අතර ස්වාමි පුරුෂයා බිරිඳ අතහැර වෙනත් බිරිඳක් හා ජීවත් වීමට පටන් ගන්නා ලදී.

දිනක් බිරිඳ ස්වාමි පුරුෂයා මුණගැසී සාකච්ඡා කල අතර එහිදී පවුම් 40 ක මුදලක් බිරිඳට ගෙවීමටත් උකස අවසානයේදී නිවස සම්පූර්ණයෙන්ම බිරිඳට පැවරීමටත් ස්වාමි පුරුෂයා විසින් එකඟ වන ලදී.

එම එකඟතාවය ලිඛිතව අත්සන් කර දෙන තෙක් රථයෙන් නොබැස බව බිරිඳ කියා සිටි බැවින් ස්වාමියා විසින් මෙම එකඟතාව ලිඛිතව අත්සන් කර බිරිඳට ලබා දෙන ලදී.

කෙසේ නමුත් උකස අවසානයේදී බිරිඳගේ නමට දේපල පැවරීම ස්වාමි පුරුෂයා ප්‍රතික්ෂේප කල බැවින් ඇයට සිදු වූ අලාභය අයකර ගැනීමට ඔහුට විරුද්ධව නඩු පවරන ලදී.

මෙහිදී අධිකරණය තීරණය කරනු ලැබුවේ,

i. මෙය ගෘහස්ථ ගිවිසුමක් බවත් එබැවින් එවැනි ගිවිසුම්වලට අදාලව පාර්ශවකරුවන් අතර බරපතල චේතනාවක් නොපැවැති බවට පූර්ව නිගමනය කරන බවයි.
ii. නමුත් පාර්ශවකරුවන් මෙම ගිවිසුමට ඇතුලත් වී ඇති ආකාරය සලකා එකී පූර්ව නිගමනය බිඳීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී ඇත.
iii. එම නිසා අදාල පූර්ව නිගමනය බිඳවැටී පාර්ශවකරුවන් අතර වලංගු ගිවිසුමක් හට ගෙන ඇත.
iv. එම නිසා බිරිඳට ස්වාමි පුරුෂයාගෙන් අලාභ අයකළ ගත හැක.

## 2. වාණිජමය ගිවිසුම් (Commercial Contracts)

**වාණිජමය ගිවිසුම් යනු**

..............................................................................................................................................

..............................................................................................................................................

මෙවැනි ගිවිසුම වලට අදාල පූර්ව නිගමනය වන්නේ පාර්ශවකරුවන් අතර නෛතික සම්බන්ධතා ඇති කර ගැනීමට බරපතල වූ චේතනාවක් පැවති බවයි. නමුත් මෙයද බිඳහෙලිය හැකි පූර්ණ නිගමනයකි.

## ගිවිසුම් ආකෘතිය

සාමාන්‍ය පිළිගැනීම වන්නේ පාර්ශවකරුවන්ට ඔවුන් කැමති ඕනෑම ආකාරයකට ගිවිසුම්වලට ඇතුලත් විය හැකි බවයි.

එසේ වුවද සීමිත අවස්ථා කිපයකදී පමණක් යම් ආකෘතියකට අනුකුව ගිවිසුම් වලට ඇතුලත් විය යුතු බව ව්‍යවස්ථාවල දක්වා ඇත.

එවැනි අවස්ථාවලදී පාර්ශවකරුවන් ව්‍යවස්ථාපිත නීතියෙන් නියම කර ඇති නියමිත ආකෘතියට එවැනි ගිවිසුම් වලට ඇතුලත් විය යුතුය.

එසේ කටයුතු කර නොමැති විටකදී එවැනි ගිවිසුමක් ක්‍රියාත්මක කළ නොහැකි ගිවිසුමක් බවට පත්වේ. (Unenforceable Contract)

එනම් යම් පාර්ශවයක් අදාල ගිවිසුම කඩ කලේ නම් අහිංසක පාර්ශවයට අධිකරණයක් වෙත ගොස් කිසිදු හෝ සහනයක් ලබාගත නොහැකි ගිවිසුමක් බවට පත්වේ.

**උදා: 01** 1840 වංචා වැලැක්වීමේ ආඥා පනතේ 18 වන වගන්තිය අනුව හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රු. 1,000 ට වඩා වැඩිනම් හවුල්කරුවන් අතර එහි ගිවිසුම ලිඛිත විය යුතුය.

**උදා: 02** වංචා වැලැක්වීමේ ආඥා පනතේ 2 වන වගන්තිය අනුව නිශ්චල දේපලක අයිතිය හෝ සීමිත අයිතිවාසිකම් (උදා: බදුදීම) පැවරීමේදී ඇතුලත් වන ගිවිසුම ඔප්පුවක් මගින් සිදුකළ යුතුය.

**උදා: 03** සාමාන්‍ය විවාහ ආඥාපනතේ 19 වන වගන්තිය විවාහ පොරොන්දු කඩ කිරීම මත අලාභ ඉල්ලා නඩු පැවරීමට එකී පොරොන්දුව ලිඛිතව දී තිබිය යුතුයි.

**<u>ගිවිසුමක ඇතුලත් කරුණු</u>**

ගිවිසුමක ඇතුලත් කරුණු කොටස් 2 කට බෙදිය හැක.

**1. ප්‍රකාශිත කරුණු (Express Terms)**
එනම් අදාල ගිවිසුම යටතේ පාර්ශවකරුවන් ලිඛිතව හෝ වාචිකව එකඟ වී ඇති කරුණු වේ.

**2. වටහාගත හැකි කරුණු (Implied Terms)**
ගිවිසුමක ප්‍රකාශිත කරුණු වලට අමතරව වටහාගත හැකි කරුණු ද ඇතුලත් වේ. පහත සඳහන් ක්‍රම වලට වටහාගත හැකි කරුණු ගිවිසුම් වලට ඇතුලත් වේ.

i. යම් කරුණක් එකි ගිවිසුමට ඇතුලත් වන බව ඉතා පැහැදිලිව පෙනීයාම මත

**උදා:** A විසින් B ට රු. ලක්ෂ 50 ක් වටිනා නවින මෝටර් රථයක් විකිණීමට ගිවිසුමට ඇතුලත් වේ.

ගිවිසුමේ ප්‍රකාශිතව සඳහන් නොවුවද A විසින් සපයන මෝටර් රථයට ඇන්ජිමක් තිබිය යුතු බවට ගිවිසුමට එළැඹෙන අවස්ථාවේදී පාර්ශවයම දනසිටි බව සාධාරණව නිගමනය කළ හැක. එබැවින් එහි වටහාගත හැකි කරුණකි.

ii. වෙළඳ පරිචය මගින්
දිගුකාලින වෙළඳ පරිචයක් මත යම් යම් කරුණු ගිවිසුම් වලට වටහාගත හැකි කරුණු ලෙස යෙදේ.

**උදා:** සිසිල් බීම බෝතලයක් පානය කර හිස් බෝතලය නැවත වෙළෙන්දාට ලබාදීම වෙළඳ පරිචයකි. එහෙත් භාවිතයෙන් පසුව කොඩියල් බෝතල් වෙළෙන්දාට නැවත බාරදීමට වෙළඳ පරිචයක් නැත.

iii. යම් ව්‍යාවස්ථාවක ඇති විධිවිධාන හේතුකොට ගෙන යම් යම් කරුණු ගිවිසුම් වල වටහාගත හැකි කරුණු ලෙස යෙදේ.

**උදා:** භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ සඳහන් වටහාගත යුතු කරුණු

**ගිවිසුමක ඇතුලත් කොන්දේසි හා ප්‍රතිඥාහාර (Conditions and Warranties)**

ගිවිසුමක ඇතුලත් සියළුම කරුණු (එනම් ප්‍රකාශිත හා වටහාගත හැකි කරුණු) එම ගිවිසුමේ කොන්දේසි හා ප්‍රතිඥාහාර ලෙස බෙදා දැක්විය හැක.

**කොන්දේසි (Conditions)**

ගිවිසුමේ පැවැත්මට අත්‍යාවශ්‍ය වන්නාවූ, සාපේක්ෂකව වැදගත්කමක් වැඩි කරුණු කොන්දේසි ලෙස හැඳින්වේ.

ගිවිසුමක කොන්දේසියක් කඩ වූ විටකදී අහිංසක පාර්ශවයට පහත පරිදි ක්‍රියාකළ හැක.

i. තම අභිමතය පරිදි ගිවිසුම අවසන් කළ හැක.

ii. කොන්දේසිය කඩවීම හේතුවෙන් යම් අලාභයක් සිදුව ඇත්නම් එම අලාභය කොන්දේසිය කඩ කළ පාර්ශවයෙන් අයකර ගත හැක.

**ප්‍රතිඥාහාර (Warranties)**

ගිවිසුමේ පැවැත්මට අත්‍යවශ්‍ය නොවන සාපේක්ෂව වැදගත්කමින් අඩු කරුණු මේ නම් වේ. ප්‍රතිඥාහාරයක් කඩ වූ විටකදී අහිංසක පාර්ශවයට ඇති එකම සහනය වන්නේ අලාභ ඉල්ලා සිටීම පමණි. අහිංසක පාර්ශවයට ගිවිසුම අවසන් කළ නොහැක.

උදා: **<u>Bettini Vs Gye</u>**

නට්‍යශාලා හිමියෙක් ගායිකාවක් සමඟ මහජනයා ඉදිරියේ ප්‍රසංගයක් දින කිපයක් පැවැත්වීමට ගිවිසුමකට ඇතුළු විය. ප්‍රසංගය ආරම්භ කිරීමට දින 6 කට පෙර පෙරහුරු ගායනයක් සඳහා ගායිකාව පැමිණීමට නියමිත වූ නමුත් ඇය ඒ සඳහා පැමිණියේ නියමිත දිනට දින 3 කට පසුවය.

මෙම තත්ත්වය යටතේ නාට්‍යශාලාහිමියා අදාල ගිවිසුම අවසන් කරන ලදී. එයින් තමාට සිදුවූ අලාභ අයකර ගැනීමට ගායිකාව නාට්‍යශාලා හිමියාට නඩු පවරන ලදී.

මෙහිදී අධිකරණය තීරණය කරනු ලැබුවේ මෙම ගිවිසුමේ වැදගත්ම කරුණ වන්නේ ප්‍රසංගය මිස පෙරහුරු ගායනය නොවේ. එමනිසා ගායිකාව විසින් කඩකර ඇත්තේ ප්‍රතිඥාහාරයක් පමණක් බැවින්, එසේ ගිවිසුම අවසන් කිරීමට ඔහුට හිමිකමක් නොමැති බවයි.

**අනාමික පදය – Innominate Terms / Intermediate terms**

එනම් යම් කැණක් පැහැදිලි ලෙස කොන්දේසියක් ද ප්‍රතිඥාහාරයක්ද යනුවෙන් වෙන් කල නොහැකි නම් එවැනි කරුණු මෙලෙස හැඳින්වේ. මෙවැනි කරුණු කොන්දේසියක හා ප්‍රතිඥාහාරයක අතරමැදි ලක්ෂණ පෙන්නුම් කරයි. එමනිසා ඇතැම් අවස්ථාවල මෙවැනි වගන්තියක් කඩ වූ විට ගිවිසුම අවසන් කල හැක. ඇතැම් අවස්ථාවලදී අලාභ පමණක් අය කරවා ගත හැක.

## මුක්ත වගන්ති - EXEMPTION CLAUSES

**මුක්ත වගන්ති යනු,**

.............................................................................................................................................

.............................................................................................................................................

බැලූ බැල්මටම මුක්ත වගන්තියක් සාධාරණ නොවන බව පෙනී ගියද, මුක්ත වගන්ති වලංගු වගන්ති කොට්ඨාශයක් ලෙස ගිවිසුම නීතියෙන් පිළිගනු ලබයි. මන්ද පාර්ශවකරුවන්ට ඔවුන් කැමති කරුණුවලට අනුකූලව ගිවිසුම් වලට ඇතුලත්වීමේ නිදහස පැවතිය යුතු බව ගිවිසුම නීතිය පිළිගන්නා බැවිනි.

එසේ වුවද පහත සඳහන් කරුණු ලබන අවස්ථාවලදී අදාල මුක්ත වගන්තිය වලංගු නොවන බව අධිකරණය තීරණය කර ඇත.

i. පාර්ශවකරුවන් ගිවිසුමට ඇතුලත්වීමෙන් පසුව යම් පාර්ශවයක් විසින් එක පාර්ශිකව මුක්ත වගන්තියක් ගිවිසුමට ඇතුලත් කරයි නම් එය වලංගු නොවේ.

උදා: **<u>Oliey Vs Malborought Court</u>**

නිවාඩුවක් ගත කිරීම සඳහා විත්තිකාර හෝටල් සමාගමට ගිය පැමිණිලි කාරිය පිළිගැනීම් කවුන්ටරයේදී කාමරයක් වෙන් කරවා ගෙන පසුව කාමරයට ගිය අවස්ථාවේදී එහි දැන්වීමක් පළකර තිබෙනු දක්න ලදී.

දැන්වීමේ සඳහන් වුයේ අමුත්තන්ගේ වටිනා දේපල නැතිවුවහොත් ඒ පිළිබඳ සමාගම වග නොකියන බවයි. (මුක්ත වගන්තියකි)

පැමිණිලිකාරිය කාමරයෙන් පිට සිටි අවස්ථාවකදී කාමරය තුල තිබු ඇගේ වටිනා භාණ්ඩ සොරාගෙන තිබුනි.

විත්තිකාර හෝටල් සමාගමේ තර්කය වූයේ පලකර තිබූ දැන්වීමේ ආරක්ෂාව ඔවුන්ට ලැබෙන බවත් එම නිසා පැමිණිලිකාරියට සිදුවූ අලාභ සඳහා ඔවුන් වගකීමට නොබැඳෙන බවත්ය.

මෙහිදී අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ,

පාර්ශවකරුවන් ගිවිසුමට ඇතුලත්වීමෙන් පසුව එක පාර්ශවිකව අදාල මුක්ත වගන්තිය ගිවිසුමට ඇතුලත් කර ඇති බැවින් එහි මුක්ත වගන්තිය වලංගු මුක්ත වගන්තියක් නොවන බවයි. එමනිසා පැමිණිලිකාරියට අලාභ ගෙවීමට විත්තිකාර සමාගම වගකීමකට බැඳේ.

ii. පාර්ශවකරුවන් ගිවිසුමකට ඇතුල්වන මොහොතේදී නිකුත් කළ අත්සන් නොකළ ලේඛනයක සාධාරණව දැකගත නොහැකි වන පරිදි යම් මුක්ත වගන්තියක් ඇතුලත් කර ඇත්නම් එය වලංගු නොවේ.

උදා: **<u>Chapelton Vs Barry U.D.C</u>**

A විසින් B ගෙන් පුටු 2 ක් කුලියට ගැනීමට ගිවිසුමකට ඇතුළු වූ අතර කුලියට ගත් පුටුවක් කඩා වැටීමෙන් A ට තුවාල සිදුවේ.

ගිවිසුමට ඇතුලත් වන මොහොතේ දී B විසින් නිකුත් කළ A විසින් අත්සන් නොකළ රිසිට් පත්‍රයේ පිටපැත්තේ ඉතා කුඩා අකුරින් සඳහන් කර තිබුණේ කුලියට දෙන පුටුවල ඇති දෝෂ හේතුවෙන් යමෙකුට තුවාල හෝ අලාභ වුවහොත් ඒ පිළිබඳව B වගනොකියන බවයි. (මුක්ත වගන්තියකි)

මෙහිදී අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ A විසින් අත්සන් කර නොමැති රිසිට්පතේ සඳහන් මුක්ත වගන්තිය ගිවිසුමකට ඇතුලත් වන මොහොතේදී සාධාරණව දැකගත නොහැකි පරිදි යොදා ඇති බැවින් එය වලංගු මුක්ත වගන්තියක් නොවන බවයි. එමනිසා A ට සිදුවූ අලාභ B විසින් ගෙවිය යුතු බවයි.

iii. පාර්ශවකරුවන් ගිවිසුමට ඇතුලත්වන අවස්ථාවේදී මුක්ත වගන්තියක් ඇතුලත් ලේඛනයක් අත්සන් කර ඇත්නම් එම අත්සන් කළ පාර්ශවය අදාල මුක්ත වගන්තිය කියවා බලා තිබුණත් එම මුක්ත වගන්තිය වලංගු මුක්ත වගන්තියක් වේ. නමුත් එම මුක්ත වගන්තිය සහිත ලේඛනය අත්සන් කර ඇත්තේ එම මුක්ත වගන්තිය පිළිබඳව ලබාදුන් වැරදි අර්ථ නිරූපණයක් මත විශ්වාසය තබා නම් එවිට එම මුක්ත වගන්තිය වලංගු නොවේ.

උදා: **<u>Curtis Vs Chemical deanning Co. Ltd</u>**

පැමිණිලිකාරිය සතු වටිනා මංගල ඇඳුම පිරිසිදු කර ගැනීම සඳහා විත්තිකරුවන්ට බාරදුන් අවස්ථාවේදී මුක්ත වගන්තියක් සහිත ලේඛනයක් අත්සන් කරදෙන මෙන් පැමිණිලිකාරියගෙන් ඉල්ලා සිටින ලදී.

අදාල මුක්ත වගන්තියේ සඳහන් වුයේ විත්තිකරු බාරගන්නා ඇඳුම් වලට සිදුවන අලාභ සඳහා වගනොකියන බවයි.

ඒ අනුව පැමිණිලිකාරිය විසින් අදාල මුක්ත වගන්තිය පිළිබඳව පැහැදිලි කිරීමක් විත්තිකරුගෙන් ඉල්ලා සිටින ලදී. එම අවස්ථාවේ දී විත්තිකරු ප්‍රකාශ කර සිටියේ මෙම මුක්ත වගන්තියෙන් අදහස් කරන්නේ ඇඳුම්වලට සවිකර ඇති ස්විකින්ස් හා බීඩ්ඩ් වලට හානියක් වුවහොත් ඒ පිළිබඳ පමණක් වගනොකියන බවයි.

මෙම පැහැදිලි කිරීම මත විශ්වාස තැබූ පැමිණිලිකාරිය මෙම ලේඛනයට අත්සන් කරන ලදී. ඇඳුම පිරිසිදු කිරීමේදී සමාගමේ සේවකයින් අධික සායම් ප්‍රමාණයක් යෙදීම හේතුවෙන් ඇඳුමට අලාභ සිදුවිය.

මෙහිදි අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ. පැමිණිලිකාරිය විසින් මුක්ත වගන්තිය සහිත ලේඛනය අත්සන් කර ඇත්තේ විත්තිකරු විසින් දුන් වැරදි අර්ථ නිරූපනය මත විශ්වාසය තබා වන බැවින් එම මුක්ත වගන්තිය වලංගු නොවන බවයි.

එමනිසා විත්තිකරු විසින් පැමිණිලිකාරියට සිදුවූ අලාභ සඳහා වගකීමට බැදේ.

iv. 1997 අංක 26 දරණ අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත අනුව,

i. නොසැලකිල්ල මත සිදුවන මරණ හෝ පුද්ගලයින්ට වන තුවාල පිළිබඳ වගකීම බැහැර කරන හෝ සීමාකරන වගන්තියක් වලංගු නොවේ.

ii. නොසැලකිල්ල හෝ ගිවිසුම් කඩ කිරීම මත සිදුවන වෙනත් යම් අලාභ බැහැර කරන වගන්තියක්, යුක්ති සහගත නම් පමණක් වලංගු වේ.

**ගිවිසුමක් අවලංගු කරවාගත හැකි අවස්ථා**

පාර්ශවකරුවන් ගිවිසුමකට ඇතුල්වීමෙන් පසුව වුවද පහත සඳහන් කරනු ලබන අවස්ථාවලදී එම ගිවිසුම වලංගු නොවන බව අධිකරණය මගින් ප්‍රකාශ කරවා ගත හැක.

1. වැරදීම (Mistake)
2. වරදවා දැක්වීම/ අවනිදේශනය (Misrepresentation)
3. බියගැන්වීම (Duress)
4. අනිසි බලපෑම (Undue influence)

## 1. වැරදීම (Mistake)

වැරදීම ආකාර 3 කට වර්ග කර දැක්විය හැක.

**1. පොදු වැරදීම්**

එනම් ගිවිසුමේ දෙපාර්ශවයම එකම වැරදීමකට යටත්ව ගිවිසුමකට ඇතුලත්ව තිබිම මෙලෙස හැදින්වේ. විශේෂයෙන්ම ගිවිසුමේ **<u>විෂය වස්තුවේ පැවැත්ම පිළිබඳව</u>** පොදු වැරදීමකට යටත්ව පාර්ශවකරුවන් ගිවිසුමකට ඇතුලත්ව ඇති විටකදී එම ගිවිසුම හිස් ගිවිසුමක් බවට පත්වේ. (Void Contracts)

එම නිසා එම ගිවිසුම වලංගු නොවන බව අධිකරණය මගින් ප්‍රකාශ කරවාගත හැක.

උදා: **<u>Couturier Vs Hastie</u>**

A විසින් ආනයනය කර තිබූ තිරිඟු තොගයක් B ට විකිණීමට ගිවිසුමකට ඇතුලු විය. එසේ ගිවිසුමට එළඹෙන අවස්ථාවට පෙර තිරිඟු තොගය ප්‍රවාහනය කරමින් තිබූ නැවේ කපිතාන්වරයා එය ඉක්මණින් නරක්වේ යැයි සිතා අතරමග වරායකදී වෙනත් අයෙකුට විකුණා තිබුණි.

ඉහත කී තත්ත්වය මත එකඟ වූ පරිදි B ට තිරිඟු සැපයීමට A ට නොහැකිවීම මත, B ට සිදුවූ අලාභ අයකර ගැනීමට A ට එරෙහිව නඩු පවරන ලදී.

මෙහිදී අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ,

i. නොපවතින විෂය වස්තුවක් පවතින බවට A හා B විශ්වාසය තබා මෙම ගිවිසුමට ඇතුලත්ව ඇත.

ii. එම නිසා මෙම ගිවිසුමේ විෂය වස්තුවේ පැවැත්ම පිළිබඳ පාර්ශවකරුවන්ට පොදු වැරදීමක් සිදුව ඇත.

iii. මේ අනුව ඔවුන් ඇතුලත්ව ඇති ගිවිසුම හිස් ගිවිසුමක් වන බැවින් වලංගු ගිවිසුමක් නොවේ.

iv. B ට සිදුවූ අලාභ A ගෙන් අයකරවා ගත නොහැක.

## 2. අන්‍යෝන්‍ය වැරදීම (Mutual Mistake)

ගිවිසුමේ පාර්ශවකරුවන් දෙදෙනාම විවිධ වැරදීම් වලට යටත්ව ගිවිසුමට ඇතුලත්ව තිබීම මෙලෙස හැඳින්වේ.

විශේෂයෙන්ම ගිවිසුමේ විෂය **වස්තුවේ අනන්‍යතාවය පිළිබඳව** අන්‍යෝන්‍ය වැරදීමකට යටත්ව පාර්ශවකරුවන් ගිවිසුමකට ඇතුලත්ව තිබේ නම් එම ගිවිසුම හිස් ගිවිසුමක් බවට පත්වේ. එබැවින් එම ගිවිසුම වලංගු නොවන බව අධිකරණය මගින් ප්‍රකාශ කරවා ගත හැක.

උදා: **Raffles Vs Wichelhaus**

A හා B පිළිවෙලින් කපු තොගයක් විකිණීමට හා මිලදීගැනීමට ගිවිස ගන්නා ලදී. A විසින් එක් කපු තොගයක් ඔක්තෝම්බර් මාසයේදීද තවත් තොගයක් දෙසැම්බර් මාසයේදීද ආනයනය කිරීමට නියමිතව තිබුණි.

ඔක්තෝම්බර් මාසයේ ලැබෙන තොගය මිලදී ගන්නා බව සිතමින් B ගිවිසුමට ඇතුල් වූ අතර, A ගිවිසුම ඇතුල් වූයේ දෙසැම්බර් මාසයේ තොගය විකුණා බව සිතාය.

මෙහිදී අධිකරණය තීරණය කරනු ලැබුවේ ගිවිසුමේ විෂය වස්තුවේ අනන්‍යතාව පිළිබඳව පාර්ශවකරුවන්ට අන්‍යෝන්‍යය වැරදීමක් සිදුව ඇති බැවින් මෙය හිස් ගිවිසුමක් වන බවයි. එමනිසා දෙසැම්බර් තොගය B ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් A ට වූ අලාභය B ගෙන් අයකරවා ගත නොහැක.

## 3. ඒකපාර්ශවික වැරදීම

ගිවිසුමේ එක් පාර්ශවයක් පමණක් වැරදීමකට යටත්ව යම් ගිවිසුමකට ඇතුලත්ව තිබීම මෙලෙස හැඳින්වේ. මෙවැනි වැරදීම් සිදුවන බහුල අවස්ථාවක් වන්නේ ගිවිසුමේ පාර්ශවකරුවෙකුගේ අනන්‍යතාව පිළිබඳ සිදුවන ඒකපාර්ශවික වැරදීමයි.

උදා: X අනික් පාර්ශවය Z යැයි සිතමින් ගිවිසුමකට ඇතුලත් වේ. පසුව අනෙක් පාර්ශවය Z නොව Y බව පෙනී යයි. මෙය පාර්ශවකරුවෙකුගේ අනන්‍යතාව පිළිබඳව සිදු වූ ඒකපාර්ශවික වැරදීමකි.

පාර්ශවකරුවෙකුගේ අනන්‍යතාව පිළිබඳ සිදුවූ ඒකපාර්ශවීය වැරදීම එම ගිවිසුමේ **වැදගත් කරුණක් ලෙස සැලකිය හැකිනම්** එවිට එම ගිවිසුම හිස් ගිවිසුමක් බවට පත්වේ.

අනන්‍යතාව පිළිබඳ සිදුවූ ඒකපාර්ශවික වැරදීම ගිවිසුමේ වැදගත් කරුණක් ද නැද්ද යන්න නිගමනය කිරීමට ගිවිසුම් වර්ග 2 කට බෙදා සලකා බැලිය යුතුය.

i. මුහුණට මුහුණලා ඇතුලත් වන ගිවිසුම්

ii. පණිවිඩ හුවමාරුව මත ඇතුලත් වන ගිවිසුම්

**මුහුණට මුහුණලා ඇතුලත් වන ගිවිසුම්**

මුහුණට මුහුණලා ඇතුලත් වන ගිවිසුමක යම් පාර්ශවයකගේ අනන්‍යතාව පිළිබඳව ඒකපාර්ශවික වැරදීමක් සිදුවී ඇත්නම්, එම පුද්ගලයා තමා ඉදිරියේ සිට අදාල ගිවිසුමට ඇතුලත් වූ බැවින්, එම වැරදීම ගිවිසුමේ වැදගත් කරුණක් ලෙස නොසැලකේ.

එම නිසා එම ගිවිසුම පසුව අවලංගු කරවා ගත නොහැක.

උදා: **Philips Vs Brooks**

ස්වර්ණාභාරණ සාප්පු හිමියෙක් වූ A ගේ සාප්පුවට පැමිණි අයෙක් තමා ශ්‍රීමත් G. B. ලෙස හඳුන්වා දෙනු ලැබීය.

ශ්‍රීමත් ජී. ඒ. ලෙස හඳුන්වා දුන් පුද්ගලයා වටිනා මුදුවක් මිලදී ගෙන එහි මිල චෙක්පතකින් ගෙවන ලදී. පාසුව A ට අනාවරණය වුයේ අදාල චෙක්පත්‍රය කූටරචනය කළ චෙක්පතක් බවත් මුදුව මිලදීගෙන ඇත්තේ X නැමති වංචනික පුද්ගලයා විසින් බවත්ය.

එමෙන්ම එම මුදුව Y නැමති උකස්කරු වෙත උකස් කර ඇති බවත් අනාවරණය විය.

මෙම තත්ත්වය යටතේ මුදුව තමා වෙත ලබාගැනීම සඳහා තමා X සමඟ ගිවිසුමට ඇතුලත්ව ඇත්තේ ඔහුගේ අනන්‍යතාවය පිළිබඳව සිදු වූ ඒකපාර්ශවික වැරදීමක් මත බව පවසමින් එම පදනම් මත එම ගිවිසුම අවලංගු කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදී අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ,

i. මෙය මුහුණට මුහුණලා ඇතුලත් ගිවිසුමකි.
ii. එවැනි ගිවිසුමක පාර්ශවකරුවන්ගේ අනන්‍යතාව පිළිබඳව සිදුවන එකපාර්ශවික වැරදීම ගිවිසුමේ වැදගත් කරුණක් නොවේ.
iii. එබැවින් එකී පදනම මත අදාල ගිවිසුම අවලංගු කළ නොහැක.

**පණිවිඩ හුවමාරුව මත ඇතුලත් වන ගිවිසුම්**

පාර්ශවකරුවන් ගිවිසුමට ඇතුලත්ව ඇත්තේ පණිවිඩ හුවමාරු ක්‍රම තුලින් නම් (තැපැල්, දුරකථන, ෆැක්ස්) එවැනි ගිවිසුමක යම් පාර්ශවයකගේ අනන්‍යතාවය පිළිබඳව ඒකපාර්ශික වැරදීමක් සිදුව ඇත්නම් එය ගිවිසුමේ වැදගත් කරුණක් ලෙස සැලකේ. එබැවින් එවැනි ගිවිසුමක් හිස් ගිවිසුමක් ලෙස සලකනු ලබයි.

උදා: **<u>Candy Vs Lindsay</u>**


Cheap side wood street අංක 37 දරණ ස්ථානයේ පදිංචි Blenkarn නමැති වංචනික පුද්ගලයා A ගෙන් භාණ්ඩ තොගයක් ඇණවුම් කර තිබුනි. ඔහු අදාල අර්පණ ලිපිය එම මාර්ගයේම ව්‍යාපාරයක් කරගෙන ගිය Blenkison සමාගම යනුවෙන් අත්සන් කර තිබුණි.

තමාවෙත ඇණවුම ඉදිරිපත් කර ඇත්තේ පිළිගැනීමක් ඇති Blenkison සමාගම යැයි සිතූ A අදාල භාණ්ඩ තොගය Blenkarn ගේ ලිපිනයට යවන ලදී. Blenkarn භාණ්ඩ සඳහා නියමිත මිල ගෙවීම පැහැර හරින ලදී.

මෙම තත්ත්වය යටතේ අදාල භාණ්ඩ තොගය ආපසු ලබාගැනීම සඳහා තමා Blenkarn සමග මෙම ගිවිසුමට ඇතුලත්ව ඇත්තේ ඔහුගේ අනන්‍යතාවය පිළිබඳ සිදුවූ එකපාර්ශික වැරදීමක් මත බව පවසමින්, එම පදනම මත ගිවිසුම අවලංගු කරන ලෙස A අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදී අධිකරණය තීරණය කරනු ලැබුවේ,

i. මෙය පණිවිඩ හුවමාරුව මත ඇතුලත් වූ ගිවිසුමක් බවත්
ii. එම නිසා පාර්ශවයකගේ අනන්‍යතාව පිළිබඳ සිදුවන ඒකපාර්ශවික වැරදි එම ගිවිසුමේ වැදගත් කරුණක් ලෙස සැලකෙන බවත්.
iii. එබැවින් පාර්ශවකරුවන් අතර ඇති ගිවිසුම හිස් ගිවිසුමක් බවට පත් වී ගිවිසුම වලංගු නොවන බවත් ප්‍රකාශ කරන ලදී.



## 2. වරදවා දැක්වීම / අවනිදේශනය

පාර්ශවකරුවන් ගිවිසුමට ඇතුල්වීමට පෙර එම ගිවිසුමේ යම්යම් කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට ඉඩ ඇත.

එම සාකච්ඡා වලදී එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවයට යම් යම් වැරදි සහගත කරුණු ප්‍රකාශ කර ඇත්නම් ඒවා වරදවා දැක්වීම් ලෙස හඳුන්වනු ලබයි.

මෙම වරදවා දැක්වීම මත අගතියට පත් පාර්ශවයට තම අභිමතය පරිදි එම ගිවිසුම වලංගු නොවන බව අධිකරණය මගින් ප්‍රකාශ කරවා ගත හැක. එනම් මෙවැනි ගිවිසුම් හිස්කළ හැකි ගිවිසුම් ලෙස හඳුන්වනු ලබයි.

වරදවා දැක්වීමක් මත ගිවිසුමක් අවලංගු කරවා ගැනීමට පහත සඳහන් කරුණු සියල්ල අගතියට පත් පාර්ශවය විසින් ඔප්පු කළ යුතුය.

i. අදාල වරදවා දැක්වීම ගිවිසුමට ඇතුළුවීමට පෙර සිදු කළ බව
ii. ගිවිසුමේ අනෙක් පාර්ශවය විසින් වරදවා දැක්වීම සිදු කළ බව
(මේ අනුව 3 වන පාර්ශවය විසින් කළ වරදවා දැක්වීම මත ගිවිසුමක් අවලංගු කරවාගත නොහැක.)
iii. වරදවා දැක්වීම සිදු කලේ තමාව ගිවිසුමට ඇතුලත් කරවා ගැනීමට පොළඹවා ගැනීමට බව
iv. එම පෙළඹවීම මත තමා ගිවිසුමට ඇතුලත් වූ බව

**<u>අසත්‍ය මත ප්‍රකාශයක් වරදවා දැක්වීමක් නොවේ.</u>**

පාර්ශවකරුවන් ගිවිසුමට ඇතුලු වීමට පෙර එම ගිවිසුමේ එක් පාර්ශවයක් විසින්, අනෙක් පාර්ශවයට අසත්‍ය මතයක් ප්‍රකාශ කර ඇත්නම් එය වරදවා දැක්වීම ලෙස සැලකිය නොහැක.

**<u>Bisset Vs Wilkinson</u>**

ගොවිපලක් විකිණූ අයෙකු එහි බැටළුවන් 200 ක් රැඳවිය හැකි බව ගිවිසුමට ඇතුලුවීමට පෙර ප්‍රකාශ කර තිබුණි. පසුව එය අසත්‍යක් බව බව තහවුරු විය.

මෙම තත්ත්වය යටතේ ගොවිපල මිලදීගත් අය විසින් එම ගිවිසුම අවලංගු කරවා ගැනීමට නඩු පවරන ලදී.

මෙහිදී අධිකරණය තීරණය කරනු ලැබුවේ මෙය අසත්‍ය මත පලකිරීමක් වන බැවින් ගිවිසුම අවලංගු කරවාගත නොහැකි බවයි.

**වරදවා දැක්වීම වර්ග 3 ක් ඇත.**

**i. අහිංසක වරදවා දැක්වීම**

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

මෙවැනි අවස්ථාවකදී අගතියට පත් පාර්ශවයට ඇති එකම සහනය වන්නේ ගිවිසුම අවලංගු කරවා ගැනීම පමණි. අලාභ ඉල්ලා සිටිය නොහැක.

**ii. නොසැලිකිලිමත් වරදවා දැක්වීම**

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

නොසැලිකිලිමත් වරදවා දැක්වීමක දී අගතියට පත් පාර්ශවයට ගත හැකි එකම ක්‍රියාමාර්ගය වන්නේ ගිවිසුම අවලංගු කරවා ගැනීම පමණි.

**iii. වංචනික වරදවා දැක්වීම**

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

මෙවැනි අවස්ථාවකදී අගතියට පත් පාර්ශවයට එම ගිවිසුම අවලංගු කරවා ගැනීමට මෙන්ම අගතියට පත් පාර්ශවයට සිදු වූ අලාභ අය කරවා ගත හැක.

### 3. බිය ගැන්වීම

බිය ගැන්වීමක් හේතුවෙන් ගිවිසුමක් යටතේ දෙනු ලබන කැමැත්ත නියම කැමැත්තක් නොවන බැවින් පසුව එම ගිවිසුම අවලංගු කරවා ගත හැක.

**උදා:** ශාරීරික හානියක් කරන බවට කරනු ලැබූ තර්ජනයක් මත යමෙකු ගිවිසුමකට ඇතුලත්ව ඇත්නම් පසුව එම ගිවිසුම අවලංගු කරවා ගත හැක.

### 4. අනිසි බලපෑම

ගිවිසුමේ පාර්ශවකරුවන් අතර පවතින යම් සම්බන්ධතාවක් හේතුවෙන් එක් පාර්ශවයකට අනෙක් පාර්ශවයට එරෙහිව තර්ජනයක් නොවන බලපෑමක් කිරීමට හැකියාව ඇත.

**උදා:** දෙමාපියන්ට දරුවන් කෙරෙහි
ආගමික පූජකවරුන්ට ඔවුන්ගේ අනුගාමිකයන් කෙරෙහි
වෛද්‍යවරුන්ට ඔවුන්ගේ රෝගීන් කෙරෙහි මෙවැනි බලපෑමක් කළ හැක.

මෙවැනි බලපෑමක් මත යමෙකු ගිවිසුමකට ඇතුලත්ව ඇති විටකදී පසුව එම ගිවිසුම වලංගු නොවන බව අධිකරණය මගින් ප්‍රකාශ කරවා ගත හැක.

## ගිවිසුම් ශක්නුතාව / හැකියාව - CAPACITY TO CONTRACT

සමහර පුද්ගලයින් ගිවිසුම් වලට ඇතුලුවීමේදී, ඔවුන්ට ඇති පලපුරුද්ද අඩුකම, විවිධ මානසික හේතු ආදී තත්ත්වයන් මත අවාසිදායක තත්ත්වයක සිටිය හැක.

**උදා:** බාල වයස්කරුවන්
උමතු තැනැත්තන්
බීමත් පුද්ගලයින්

මෙවැනි පුද්ගලයින් ගිවිසුම් වලට ඇතුලුවීමේදී ඔවුන්ට යම් ආරාක්‍ෂාවක් සලසාදිය යුතු බව ගිවිසුම් නීතියේ පිළිගැනීමයි.

නීතිය මොවුන්ට ආරාක්‍ෂාවක් සලසා දෙන්නේ, මොවුන් ඇතුලත් වන ගිවිසුම හිස්කළ හැකි ගිවිසුම් යන පදනම මතය. (Voidable Contracts)

එනම් මෙවැනි තැනැත්තන්ට වලංගු ගිවිසුම වලට ඇතුලත් විය හැකි වුවද, එසේ ගිවිසුමට ඇතුලත් වීමෙන් පසුව ඕනෑම විටකදී, එකපාර්ශවිකව, වගකීමකින් තොරව එම ගිවිසුමෙන් ඉවත්වීමට මොවුන්ට හැකියාව ඇත.

### බාල වයස්කරුවන්

සාමාන්‍යයෙන් බාලවයස්කරුවන් ලෙස සලකන්නේ වයස අවු. 18 ට වඩා අඩු තැනැත්තන්ය. මොවුන් ඇතුලත් වන ගිවිසුම් සලකනු ලබන්නේ ද හිස්කළ හැකි ගිවිසුම් ලෙසය.

එනම් මොවුන්ට වලංගු ගිවිසුම් වලට ඇතුලත් විය හැකි නමුත්, බාලවයස්කරුගේ අභිමතය පරිදි වගකීමකින් තොරව එම ගිවිසුමෙන් ඉවත්වීමට හැකියාව ඇත.

කෙසේ නමුත් බාලවයස්කරුවෙකු ඇතුලත් වන ගිවිසුමක් හිස්කළ හැකි ගිවිසුමක් යන මූලධර්මයට ව්‍යාතිරේකි අවස්ථා කිහිපයක් යොදා ඇත.

මෙම ව්‍යාතිරේකි අවස්ථා වලදී බාලවයස්කරුද වෙනත් පුද්ගලයින් මෙන් අදාල ගිවිසුමෙන් වගකීමට බැඳේ.

i. බාලවයස්කරුට අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට ඇතුලත් වන ගිවිසුම් වලින් බාලවයස්කරු වගකීමට බැඳේ.
යම් භාණ්ඩයක් අත්‍යවශ්‍ය ද නැද්ද යන්න නිගමනය කිරීමේදී පහත පරීක්ෂණ 2 ක් යොදා ගනී.

(a) සුදුසු බවේ පරීක්ෂණ
එනම් බාලවයස්කරුගේ ආදායම සමාජ මට්ටම ආදිය සලකා බලා එම භාණ්ඩ බාලවයස්කරුට සුදුසු තත්ත්වයක පවති ද යන්න නිගමනය කළ යුතුය.
**උදා:** මධ්‍යම පාන්තික බාලවයස්රුවෙකු වූ M තමාට අවශ්‍ය ආහාරපාන ලබාගැනීමට තරු පහේ හෝටලයක් සමඟ ගිවිසුමකට ඇතුලත් වේ.

ආහාරපාන බාලවයස්කරුට අත්‍යවශය භාණ්ඩ වුවත්, ඉහත පරීක්ෂණය අනුව අත්‍යාවශ්‍ය භාණ්ඩ ලෙස සැලකිය නොහැක.

(b) අදාල භාණ්ඩ සත්‍ය වශයෙන්ම අවශ්‍ය ද යන පරික්ෂණය
**උදා:** පාසල් යන බාලවයස්කාර M සතුව පාසල් යාම සඳහා ඇඳිය හැකි නිල ඇඳුම් කට්ටල 5 ක් ඇත. මේ බව T නැමති ටෙලර්වරයා දනී.

මෙම බාලවයස්කරු තවත් නිල ඇඳුම් කට්ටල 5 ක් මස්සවා ගැනීමට T නැමති ටේලර්වරයා සමග ගිවිසුමකට ඇතුල් වේ.

ඉහත පරීක්ෂණය අනුව එම අමතර නිල ඇඳුම අත්‍යවශ්‍ය භාණ්ඩ ලෙස සැලකිය නොහැක.

ii. බාලවයස්කරුට වාසිදායක සේවාවන්, අධ්‍යාපනික ගිවිසුම්, පුහුණුවීමේ ගිවිසුම්, ආධුනිකත්ව ගිවිසුම මගින් බාලවයස්කරු වගකීම බැඳේ.

iii. බාලවයස්කරු අදාල ගිවිසුමට ඇතුලත්ව ඇත්තේ තම බාරකරුගේ කැමැත්ත හා අවසරය ඇතිව නම් එවැනි ගිවිසුම වලින්ද බාලවයස්කරු වගකීමට බැඳේ.

iv. බාලවයස්කරු අදාල ගිවිසුමට ඇතුලත්ව ඇත්තේ වංචනිකව තමාගේ වයස වරදවා දක්වා නම් එවැනි ගිවිසුමකින්ද බාලවයස්කරු වගකීමට බැඳේ.

**බීමත් තැනැත්තන්**

යමෙක් බිමත්ව සිටියදී යම් ගිවිසුමකට ඇතුලත්ව ඇත්නම් පසුව එම ගිවිසුම වලංගු නොවවන බව අධිකරණය මගින් ප්‍රකාශ කරවා ගත හැක.

ඒ සඳහා පහත සඳහන් කරුණු 2 ඔප්පු කළ යුතුය.

i. ගිවිසුමට ඇතුලත් වන අවස්ථාවේදී එහි ස්වභාවය හා ප්‍රතිඵලය තේරුම්ගත නොහැකි මට්ටමට තමා බිමත්ව සිටි බව

ii. ගිවිසුමේ අනෙක් පාර්ශවයේ වංචාව (එනම් තමා ඒතාක්දුරට බිමත්ව සිටින බව අනෙක් පාර්ශවය දැන දැනම එම ගිවිසුමට ඇතුළු වූ බව)

**උමතු බව**

තමා ගිවිසුමට ඇතුලත් වන අවස්ථාවේදී උමතුව සිටි බව යම් පාර්ශවයකට පෙන්වා දිය හැකි නම් එම පදනම මත අදාල ගිවිසුම එම පාර්ශවයට අවලංගු කරවා ගත හැක.

මෙහිදී තමා ගිවිසුමට ඇතුලත්වන අවස්ථාවේදී උමතු බව හේතුවෙන් එහි ස්වභාවය හා ප්‍රතිඵලය තේරුම්ගත නොහැකි තත්ත්වයක සිටි බව පමණක් ඔප්පු කිරීම ප්‍රමාණවත් වේ.

එනම් ගිවිසුමේ අනෙක් පාර්ශවයේ වංචාව ඔප්පු කිරීම අවශ්‍ය නැත.

# හිස්, හිස් කළ හැකි සහ ක්‍රියාත්මක කළ නොහැකි ගිවිසුම්
# VOID, VOIDABLE & UNENFORCEABLE CONTRACTS

## <u>හිස් ගිවිසුම්</u>

**හිස් ගිවිසුම් යනු,**

................................................................................................................................................

................................................................................................................................................

................................................................................................................................................

................................................................................................................................................

................................................................................................................................................

**උදා:** වැරදීම මත අවලංගු කළ හැකි ගිවිසුම්
නීති විරෝධි ගිවිසුම්
මහජන ප්‍රතිපත්තියට පටහැනි ගිවිසුම්

### නීති විරෝධි ගිවිසුම්

පහත සඳහන් ගිවිසුම නීති විරෝධි ගිවිසුම ලෙස හැඳින්වේ.

i. නීතියෙන් තහනම් කර ඇති ක්‍රියාවක් කිරීමට පාර්ශවකරුවන් ඇතුළු වූ ගිවිසුම්

ii. නීත්‍යානුකූල ගිවිසුමකින් යම් පාර්ශවයක් නීතිවිරෝධි ප්‍රතිලාභයක් ලබාගන්නා බව ගිවිසුමට ඇතුලත්වන මොහොතේ දී දෙපාර්ශවයම දැන සිටියා නම් එවැනි ගිවිසුම් ද නීතිවිරෝධි ගිවිසුම් වේ.

**උදා:** **<u>Pearce Vs Brooks</u>**
අයතා ක්‍රම මගින් මුදල් ඉපැයූ කාන්තාවක් තමා වෙත සේවාදායකයින් ආකර්ශනය කරවා ගැනීමට ඔබ මොබ සක්මන් කිරීමට A ලවා රථයක් නිෂ්පාදනය කරවා ගැනීමට ගිවිසුමකට ඇතුලත් විය.

රථය සඳහා ගෙවිය යුතු මිල ඇය උපයන මුදලින් වාරික වශයෙන් ගෙවීමට ගිවිස ගත්තද ඇය විසින් වාරික ගෙවීම පැහැර හරින ලදී.

මෙහිදී අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ මෙම නිත්‍යානුකූල ගිවිසුම මගින් නිතිවිරෝධි ප්‍රතිලාභයක් ලබාගන්නා බව ගිවිසුමට ඇතුලත්වන අවස්ථාවේ A දැන සිටි බැවින් මෙම ගිවිසුම නීති විරෝධි ගිවිසුමක් වන බවයි. එබැවින් එය හිස් ගිවිසුමක් වේ.

හිස් ගිවිසුමක් යටතේ දෙනු ලැබූ දේපලක් මුදලක් ආපසු ඉල්ලා සිටිය නොහැක.

### මහජන ප්‍රතිපත්තියට පටහැනි ගිවිසුම්

මහජන ප්‍රතිපත්තියට පටහැනි ක්‍රියාවක් කිරීමට පාර්ශවකරුවන් යම් ගිවිසුමකට ඇතුළු වේනම් එම ගිවිසුම හිස් ගිවිසුමක් ලෙස සැලකිය යුතුය.

**උදා:** A හා B අතර විවාහය කඩා දැමීමේ අරමුණින් C හා D අතර ගිවිසුමක් ඇතිවේ නම් එය මහජන ප්‍රතිපත්තියට පටහැනි ක්‍රියාවකි. එම නිසා එය හිස් ගිවිසුමක් ලෙස සැලකිය හැක.

**හිස්කළ හැකි ගිවිසුම්**

මෙම ගිවිසුම් ආරම්භයේදී වලංගු ගිවිසුම් ලෙස සැලකෙන නමුත්, ගිවිසුමේ එක් පාර්ශවයකට තම අභිමතය පරිදි යම් හේතුවක් මත එම ගිවිසුම වලංගු නොවන බව අධිකරණය මගින් ප්‍රකාශ කරවා ගත හැක.

**උදා:** අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ මිලදී ගැනීමට බාලවයස්කරුවෙකු ඇතුලත් වන ගිවිසුම්
වරදවා දැක්වීම මත ඇතුලත් වූ ගිවිසුම්
බිය ගැන්වීම, අනිසි බලපෑම මත ඇති වූ ගිවිසුම්

**ක්‍රියාත්මක කළ නොහැකි ගිවිසුම්**

මෙවැනි ගිවිසුම් වලංගු ගිවිසුම් ලෙස සලකන නමුත් ගිවිසුමේ පවතින යම් දෝෂයක් හේතුවෙන් (උදා: ලිඛිතව නොපැවතීම) යම් පාර්ශවයක් එම ගිවිසුම කඩ කළ ද අනෙක් පාර්ශවයට අධිකරණයක් වෙත ගොස් කිසියම් හෝ සහනයක් ලබාගත නොහැකි ගිවිසුමක් බවට පත්වේ.

**උදා:** වංචා වැළැක්වීමේ ආඥාපනතේ 18 වගන්තියට පටහැනිව ඇති කරගත් හවුල් ගිවිසුම්

**ගිවිසුමක් අවසන් වන විවිධ ක්‍රම**

පහත ක්‍රම වලට ගිවිසුමක් අවසානයට පත්වේ.

**i. අන්‍යෝන්‍ය එකඟතාවය**

අදාල ගිවිසුම යටතේ පාර්ශවකරුවන් විසින් ඉටුකළ යුතු වගකීම් ඉටුකර අවසන් නොමැති නමුත්, එම ගිවිසුම අවසන් කිරීමට පාර්ශවකරුවන් එකඟවේ නම්, ඔවුන්ට වගකීමකින් තොරව එම ගිවිසුම අවසන් කළ හැක.

**ii. ගිවිසුම කඩවීම**

ගිවිසුමේ යම් පාර්ශවයක් කොන්දේසියක් කඩ කරයිනම් එම හේතුව මත අහිංසක පාර්ශවයට එම ගිවිසුම අවසන් කළ හැක.

**iii. ඉටු කිරීම**

ගිවිසුමේ පාර්ශවකරුවන් තම තමන් වෙත පැවරි ඇති වගකීම් නිසියාකාරව ඉටු කරයි නම්, ඒ සමගම ගිවිසුම අවසානයට පත්වේ.

**iv. ව්‍යාර්තවීම (Frustration)**

ව්‍යාර්තවීම යනු,

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

**ව්‍යාර්තවීමේ නෛතික ප්‍රතිඵලය කුමක් ද?**

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

**<u>පහත දැක්වෙන්නේ ව්‍යාර්තවීමෙන් ගිවිසුම් අවසන් වන අවස්ථා කීපයකි.</u>**

i. ගිවිසුමට ඇතුල්වීමෙන් පසුව ගිවිසුමේ විෂය වස්තුව විනාශ වීම

ii. පාර්ශවකරුවන් ගිවිසුමට ඇතුළු වූයේ යම් සිද්ධියක් සිදුවේය යන විශ්වාසය මත නම් එම සිද්ධිය සිදුනොවීම

උදා: **<u>Kreld Vs Henry</u>**

7 වන එඩ්වඩ් රජුගේ ඔටුනු පැළඳවීමේ උත්සවය නැරඹීමට බලාපොරොත්තු වූ A, B ගෙන් කාමරයක් කුලියට ගන්නා ලදී. නියමිත දිනයේදී රජු අසනීප වීම නිසා උත්සව කල් දමන ලදී.

ඒ අනුව කුලියට ගත් කාමරයේ කුලිය ගෙවීම A විසින් ප්‍රතික්ෂේප කරන ලදී. මෙහිදී අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ අදාල ගිවිසුම ව්‍යාර්ත වීමෙන් අවසන්ව ඇති බවත්, අදාල කුලිය ගෙවීමට A වගකීමට නොබැඳෙන බවයි.

iii. නීතිය මැදිහත්වීම

එනම් නීත්‍යානුකූලව ඉටුකළ හැකි ගිවිසුමකට පාර්ශවකරුවන් ඇතුළුවීමෙන් පසුව, පවතින නීතිය වෙනස්වීම හේතුවෙන් එම ගිවිසුම් යටතේ ඉටුකළ යුතු කාර්ය නීතිවිරෝධි බවට පත්වේ නම් එවිටද ගිවිසුම ව්‍යාර්ත වීමෙන් අවසන් වේ.

iv. සේවා සැපයීමේ ගිවිසුමකට ඇතුළුවීමෙන් පසුව, සේවය සැපයිය යුතු පාර්ශවයට සිදුවන දුබලතාවක් හේතුවෙන් එම සේවය සැපයිය නොහැකි තත්ත්වයට පත්වේ නම් එවිටද ගිවිසුම ව්‍යාර්ත වීමෙන් අවසානයට පත්වේ.

උදා: **<u>Condor Vs Barron Knight</u>**

සංගීත කණ්ඩායමක් තම බෙර වාදකයා ලෙස A ව බඳවා ගන්නා ලදී. සතියේ දින 7 ම සේවය කළ යුතු බවට A එම ගිවිසුම මගින් එකඟ වී තිබුණි.

ගිවිසුමට ඇතුළුවීමෙන් පසුව A ට වූ අසනීපයක් හේතුවෙන් සතියකට දින 4 කට වඩා සේවය නොකරන ලෙස ඔහුට උපදෙස් ලැබුණි. ඒ අනුව සංගීත කණ්ඩායම විසින් A ගේ සේවය අවසන් කරන ලදී.

මෙහිදී අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ අදාල ගිවිසුම ව්‍යාර්ථ වීමෙන් අවසන්ව ඇති බවත්, එබැවින් A ට සිදුවූ අලාභ සංගීත කණ්ඩායමෙන් ඉල්ලා සිටිය නොහැකි බවත්ය.

**<u>ගිවිසුමක් කඩ වූ විටදී අහිංසක පාර්ශවයට ලබාගත හැකි සහන</u>**

ගිවිසුමකට ඇතුළු වූ යම් පාර්ශවයක් එම ගිවිසුම කඩකර ඇති විටදී පහත සඳහන් සහන ලබාගත හැක.

**1. ගිවිසුම අවසන් කිරීම**

එනම් ගිවිසුමේ යම් පාර්ශවයක් එම ගිවිසුමේ කොන්දේසියක් කඩ කරයි නම් අහිංසක පාර්ශවයට තම අභිමතය පරිදි එම ගිවිසුම අවසන් කිරීමට හැකියාව ඇත.

**2. අලාභ අයකර ගැනීම**

ගිවිසුමක යම් පාර්ශවයක් එම ගිවිසුමේ කොන්දේසියක් හෝ ප්‍රතිඥාහාරයක් කඩ කිරීම හේතුවෙන් අහිංසක පාර්ශවයට අලාභයක් සිදු ව ඇත්නම් එම අලාභය අයකර ගැනිමට නඩු පැවරිය හැක.

**3. නියත ඉටුකිරීමේ නියෝගයක් (Specific Performance) ලබා ගැනීම. එපරිදිම ඉටු කිරීම**

එනම් කලින් ගිවිසගත් පරිදි අදාල ගිවිසුම ඉටුකරන ලෙස ගිවිසුම කඩකළ පාර්ශවයට අධිකරණය විසින් නියෝග කිරීම මෙලෙස හැඳින්වේ.

නමුත් පහත සඳහන් කරනු ලබන අවස්ථාවලදී මෙවැනි නියෝගයක් අධිකරණය විසින් ලබා නොදේ.

i. අගතියට පත් පාර්ශවයට අලාභ අය කර දීම ප්‍රමාණවත් සහනයක් වන්නේ නම් මෙවැනි නියෝගයක් ලබා නොදේ.

ii. ගිවිසුමේ එක් පාර්ශවයක් බාලවයස්කරුවෙක් නම් මෙවැනි නියෝගයක් ලබා නොදේ.
iii. අදාල කාර්ය ඉටුකිරීමට දීර්ඝ කාලයක් ගතවේ නම් උදා: විශාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම වැනි මෙවැනි නියෝගයක් ලබා නොදේ.
iv. අදාල ගිවිසුම මුදලක් ණයට දීම සඳහා ඇතුළු වූ ගිවිසුමක් නම් මෙවැනි නියෝගයක් ලබා නොදේ.

## අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත

වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන් ද එකී වෙළඳ ව්‍යාපාරවල ගණුදෙනුකරුවන් සම්බන්ධයෙන් ද, ඒකාකාරව බලපාන පනතක් ලෙස 1997 අංක 26 දරණ අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත හැඳින්විය හැකිය. මෙම පනත පැනවීමේ අරමුණ වූයේ කඩකිරීම හෝ නොසැලකිලිමත්කම හෝ වෙනත් යුතුකම් කඩකිරීම සඳහා වූ සිවිල් වගකීම ගිවිසුම් නියම මගින් හෝ අන්‍යාකාරයකින් මගහැරිය හැකි ප්‍රමාණය මත සීමා පැනවීම සහ ඊට අනුරූපිත ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමයි.

මෙම පනත මුද්‍රිත පිටු 10 කින් හා වගන්ති 13 කින් පමණක් යුතු ඉතා කුඩා පනතක් වුවද එය ව්‍යාපාරික ගිවිසුම් සම්බන්ධයෙන් ප්‍රබල බලපෑමක් කිරීමට සමත්කමක් දක්වන ඉතා වැදගත් පනතක් බව පෙනේ. මේ බව පනතේ 3,4,5,6.7,8,10 යන වගන්ති විශ්ලේෂණය කර බැලීමේදී මැනවින් පැහැදිලි වනු ඇත.

පනතේ 3(1) වැනි වගන්තියෙන් කියැවෙන්නේ නොසැලකිලිමත්කමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන මරණය හෝ පුද්ගලයන්ට සිදුකරන තුවාල සඳහා තැනැත්තකුගේ වගකීම බැහැර කිරීමට හෝ සීමා කිරීමට අදහස් කරන හෝ බැහැර කිරීමේ හෝ සීමා කිරීමේ බලපෑම් ඇති ගිවිසුම් නියමයක් හෝ තැනැත්තන්ට පොදුවේ හෝ නිශ්චිත තැනැත්තන්ට හෝ දෙන ලද දැන්වීමක් බලපෑම් රහිත විය යුතු බවයි. කොටින්ම කිවහොත් කිසියම් ගිවිසුමක යමෙකුගේ නොසැලකිලිමත්කම නිසා ඒ වගකීමෙන් මුක්තවීමේ වගන්තියක් තිබූ පලියට එකී වගකීමෙන් මිදීමට ඉඩක් මේ පනත මගින් ලබා නොදේ.

එහෙත් පනතේ 3(2) වගන්තියෙන් කියවෙන්නේ එබඳු වගකීමෙන් බැහැර කිරීමේ වගන්තියක් යුක්ති සහගත භාවයේ අවශ්‍යතාවය සපුරාලන තාක් දුරට පමණක් බලපෑම් සහිත විය යුතු බවයි. එසේම ගිවිසුම් නියමයකින් හෝ දැන්වීමකින් හෝ නොසැලකිලිමත්කම නිසා වගකීම බැහැර නොකෙරෙන බව හෝ සීමා නොකෙරෙන බව දක්වන නැතහොත් ඒ වගකීම බැහැරකිරීම සීමා කිරීමේ බලපෑම ඇති අවස්ථාවක ඒ ගිවිසුම් නියමයන්ට තැනැත්තකු එකඟවීම හෝ ඒ දැන්වීම පිළිබඳව දැනසිටීම එනයින්ම ඔහු අවදානමක් භාරගැනීම සංයුක්ත වන ලෙස තේරුම් නොගත යුතු බව අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනතේ 3(3) වගන්තියෙන් දැක්වේ.

බොහෝවිට ගිවිසුම්වලට නමට පමණක් එළඹී පසුව ඕනැකමින්ම එකී ගිවිසුම්වල නියමයන් ඉටුකිරීම පැහැරහරින තැනැත්තන් හා ආයතන මේ විවෘත ආර්ථිකය තුළ අපමණව දැකිය හැකිය. එවැනි තැනැත්තන්ට අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනතෙන් කිසිම සමාවක් නොලැබේ. පනතේ 4(1) හා 4(2) වගන්ති ඒ පිළිබඳව සවිස්තරාත්මකව කරුණු දක්වයි. එහි මූලික හරය කුළුගන්වා දක්වතොත් එයින් කියැවෙන්නේ යුක්ති සහගත වූ ගිවිසුම් නියමයන් (එහි යුක්ති සහගත බවේ පරීක්ෂණයට භාජනය වීමෙන් අනතුරුව තීරණය විය යුතුය) හෝ කිහිපයක් කඩකරන තැනැත්තකුට එවැන්නක් කිරීමට එනම් ඔහුගේ සම්පූර්ණ බැඳීමට හෝ එහි කොටසක් ඉටුකිරීම නොකර සිටීමට තමා හිමිකම් ලැබෙන්නේ යැයි කියා සිටිය නොහැකිය.

පනතේ 5 වන වගන්තිය මගින් දැක්වෙන්නේ පාරිභෝගිකයෙකු වශයෙන් කටයුතු කරන තැනැත්තකු වෙත වෙනත් යම් අයකු නොසැලකිලිමත්කම හෝ ගිවිසුම් කඩකිරීම සඳහා අනෙක් තැනැත්තාට දරන්නට සිදු වූ වගකීමක් නිදහස් කිරීම සඳහා වූ බැඳීමක් නියම කෙරෙන බව අදහස් කෙරෙන ගිවිසුම් නියමයක් බලසහිත වන්නේ එය යුක්ති සහගත නම් පමණක් බවයි.

බොහෝ පාරිභෝගික භාණ්ඩ කල්බදු ක්‍රමයට හෝ කුලී සින්නක්කර ගිවිසුම් නීතියට අනුව පහසු ගෙවීමේ වාරික ක්‍රම මත ලබාගැනීමේ ප්‍රවණතාවක් වර්තමානයේ දැකිය හැකිය. ඊට හේතු වී ඇත්තේ එකවර විශාල මුදලක් ආයෝජනය කර එබඳු සුබෝපභෝගී පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීමට වත්කමක් මෙරට බොහෝ පුද්ගලයින්ට නොමැති නිසයි. මෙවැනි මිලදී ගැනීම් වලදී තවත් පුද්ගලයකු හෝ දෙදෙනකු ඇපකරයකට අත්සන් කිරීම හෝ අදාල ගිවිසුමේ ඇපකරුවන් ලෙස අත්සන් කිරීම සිදුවේ. මේ ඇපවීම සම්බන්ධයෙන් ද 1997 අංක 26 දරණ අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනතේ දැක්වේ. එහි 6(1) වගන්තිය මීට අදාළ වේ. එමගින් දැක්වෙන්නේ සාමාන්‍යයෙන් පෞද්ගලික ප්‍රයෝජනයට හෝ පාරිභෝජනය සඳහා වූ වර්ගයක බඩු

සම්බන්ධයෙන් පාරිභෝගිකයා විසින් ප්‍රයෝජනයට ගැනීමේදී දෝෂ සහිත බව ඔප්පු වන බඩුවලින් ඇතිවන සහ බඩු නිෂ්පාදනයට හෝ බෙදාහැරීමට සම්බන්ධ තැනැත්තකුගේ නොසැලකිලිමත්කම නිසා හටගන්නා යම් අලාභයක් හෝ පාඩුවක් සඳහා වගකීම බැහැර කිරීමට හෝ සීමා කිරීමට අදහස් කෙරෙන හෝ බැහැර කිරීමේ හෝ සීමා කිරීමේ බලපෑම ඇති භාණ්ඩ සම්බන්ධයෙන් වූ ඇපවීමක අඩංගු හෝ එවැනි ඇපවීමකට යොමු කිරීම මගින් ක්‍රියාත්මක කෙරෙන ගිවිසුම් නියමයන් හෝ දැන්වීමක් බලපෑම් රහිත විය යුතු බවයි.

1997 අංක 26 දරණ අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනතේ 7 වැනි වගන්තියෙන් විස්තර කෙරෙන්නේ එකී පනත භාණ්ඩ විකිණීමේ ආඥා පනතට හා 1982 අංක 29 දරණ පාරිභෝගික ණය පනතට බලපාන ආකාරයයි. මෙම පනත් දෙකෙන්ම සිදු කෙරෙනුයේ විවිධ වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන් වෙළෙන්දා හා පාරිභෝගිකයා අතරත්, වෙළඳුන් හා වෙළඳුන් අතරත්, වෙළඳ සමාගම් හා නියෝජිතයන් අතරත්, වෙළඳ සමාගම් හා තවත් වෙළඳ සමාගම් අතරත්, විවිධාකාර වූ කොන්දේසි අන්තර්ගත ගිවිසුම් ඇතිකර ගැනීමට මගපෑදීමයි.

එසේ හෙයින් ඉහත කී පනත් දෙක භාවිතා කරමින් ඉහත කී පාර්ශවය අතර ඇතිකර ගනු ලබන වෙළඳ ගිවිසුම්වලදී කිසියම් පාර්ශවයකට අසාධාරණයක් වන්නේ නම් එය නීතියේ යුක්තිය ඉටුකිරීමේ භාවිතයට පටහැනි වනු ඇත. මේ නිසා අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනතේ 7(1) වගන්තියෙන් මෙසේ ප්‍රතිපාදන සලස්වා ඇත. එමගින් කියවෙන්නේ ඉහත කී භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 13 වැනි වගන්තියෙන් හා 1982 අංක 29 දරණ පාරිභෝගික ණය පනතේ 4(1) වන වගන්තියෙන් උද්ගත වන බැඳීම් කඩකිරීම සඳහා වූ වගකීම බැහැර කිරීමට හෝ සීමා කිරීමට අදහස් කෙරෙන හෝ ඒ වගකීම බැහැර කිරීමේ හෝ සීමා කිරීමේ බලපෑම ඇති ගිවිසුම් නියමයන් බලපෑම් රහිත වියයුතු බවයි.

මෙහිදී භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 13 වගන්තියෙන් හා පාරිභෝගික ණය පනතේ 4(1) වගන්තියෙන් උද්ගත වන බැඳීම කවරේදැයි විමසා බැලිය යුතුය.

1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 13 වන වගන්තිය මගින් භාණ්ඩයක හිමිකම පිළිබඳ ව්‍යංග කොන්දේසියක් හා වොරන්ටි දෙකක් හඳුන්වා දී ඇත.

13(අ) වගන්තියෙන් දක්වෙන්නේ විකිණුමකදී තමාට භාණ්ඩ විකිණීම සඳහා අයිතියක් ඇති බවටද, විකිණීම සඳහා වූ සම්මුතියකදී නම් හිමිකම පැවරෙන කාලයේදී භාණ්ඩ විකිණීමේ අයිතියක් තමාට හිමිවන බවද, නව ව්‍යංග කොන්දේසියකින් විකුණුම්කරු බැඳී සිටින බවයි. වෙනත් ආකාරයකින් කිවහොත් විකුණුම්කරුට භාණ්ඩ සඳහා හිමිකම තිබීම ප්‍රමාණවත් නොවන අතර, ඒවා විකිණීමට ද හැකියාව තිබිය යුතුය. භාණ්ඩ විකිණීම සඳහා අයිතියක් නැතිනම් 13(අ) වගන්තිය දක්වන ව්‍යංග කොන්දේසිය උල්ලංඝනය වන බැවින් ගැණුම්කරුට භාණ්ඩ ප්‍රතික්ෂේප කර ගිවිසුම අවලංගු කරවාගත හැකි වීමේ අයිතියක් උද්ගත වේ.

13(ආ) වගන්තියෙන් භාණ්ඩ ලබාගෙන ඒවා නිර්බාධිතව භුක්ති විඳීමට ගැනුම්කරුට හැකියාව ලබාදීම සඳහා ව්‍යංග ප්‍රතිඥා භාරයකින් විකුණුම්කරු බැඳීමට ලක්කර ඇත. එසේම භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 13(ඇ) වගන්තියෙන් දක්වෙන ආකාරයට ගිවිසුමට එළඹෙන විටදී හෝ ඊට පෙර ගැනුම්කරුට හෙළි නොකළ, ඔහු නොදන්නා කවර හෝ තෙවැනි පක්ෂයක වාසියට හේතුවන අරෝපණයක් හෝ පිළිබැඳුමකින් භාණ්ඩ නිදහස් විය යුතු බවට වූ ව්‍යංග වොරොන්ටියකින් විකුණුම්කරු බැඳී ඇත. මෙම වගන්තිය අදාළ වනුයේ තුන්වැනි පාර්ශවයකට එම භාණ්ඩ සම්බන්ධව ගිවිසුම් අයිතියක් පවතින විටදීය.

මේ නිසා භාණ්ඩ විකිණීමේ නීතියේ 13 වගන්තිය සමස්ථයක් ලෙස ගෙන ඒ සම්බන්ධයෙන් අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත බලපාන්නේ සීමාසහිත ලෙස බව පෙනේ. ඉහත කී භාණ්ඩ විකිණීමේ නීතියේ ප්‍රතිපාදන උල්ලංඝනය කිරීමට අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත උපයෝගී කරගත නොහැක.

1982 අංක 29 දරණ පාරිභෝගික ණය පනතේ 4(2), 4(3), 4(4) හා 4(5) වගන්ති පිළිබඳ අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත බලපාන්නේද සීමා කිරීම් සහිතවයි. පාරිභෝගික ණය පනතේ 4(2) වගන්තියෙන් කියැවෙන්නේ සෑම කුලී සින්නක්කර ගිවිසුමකම බඩු විකිණීමට සුදුසු තත්ත්වයකින් (වෙළඳමය ගුණයෙන්) යුක්ත විය යුතු බව ව්‍යංග කොන්දේසියක් තිබිය යුතුය. ඒ කොන්දේසිය කඩකෙරෙන ආකාරයේ ප්‍රතිපාදන පැනවීමට අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත ඉදිරිපත් නොවේ. එසේම පාරිභෝගික ණය පනතේ 4(3) වගන්තියෙන් කියැවෙන්නේ භාණ්ඩ අවශ්‍ය වන්නේ යම් විශේෂිත කාර්යයකට බවට ප්‍රකාශිතව, ලිඛිතව හෝ ව්‍යංගයෙන් අයිතිකරුට දන්වා ඇතිවිට එම භාණ්ඩ විශේෂ කාර්යයකට සුදුසු බවට ව්‍යංග කොන්දේසියක් ඇතිවන බවයි. එවැනි කොන්දේසියක් බැහැර කිරීමට අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත ඉඩ ලබානොදේ.

පාරිභෝගික ණය පනතේ 4(4) වගන්තියෙන් දක්වෙන්නේ, සාම්පලයකට යොමු කිරීමෙන් කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ බඩු කුලියට දීමත් හෝ විකිණීමකට එකඟ වීමත්, ඒ වනවිට බඩු තොගය සාම්පලයට අනුරූප වන බවට හා බඩු තොගය සාම්පලය සමග සංසන්දනය කිරීමට යුක්ති සහගත අවස්ථාවක් කුලී ගැනුම්කරු වෙත දිය යුතු බවට සඳහන් ව්‍යංග කොන්දේසි අයිතිකරු වෙත පවතී. එයද අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත මගින් ආරක්ෂා කර ඇත.

ඉහත කී පාරිභෝගික ණය පනතේ 4(5) වගන්තියෙන් කියැවෙන්නේ විස්තරයක් අනුව කුලියට දෙනවිට හෝ විකිණීමට එකඟ වනවිට භාණ්ඩ විස්තරයට අනුරූප විය යුතු බවට ව්‍යංග කොන්දේසියක් ඇති අතර, භාණ්ඩ විස්තරයක් හා සාම්පලයකට අනුව විකිණීමකදී ඒවා සාම්පලයට පමණක් අනුරූප වීම ප්‍රමාණවත් නොවන බවයි. එම භාණ්ඩ විස්තරයට ද අනුරූප විය යුතුය. මෙම කොන්දේසි කඩකිරීමට ද අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනත ඉඩ නොදේ.

1997 අංක 26 දරණ අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනතේ 8(1) වගන්තිය මීළඟට වැදගත් වේ. එමගින් කියැවෙන්නේ එම පනතේ ප්‍රතිපාදන කඩකළහොත් ඇතිවන තත්ත්වයකි. ඒ අනුව එම පනතේ විධිවිධාන යටතේ ගිවිසුම් නියමයන් එය යුක්ති සහගතභාවය පැවතීමේ අවශ්‍යතාවය සපුරාලන්නේ නම් පමණක් බලසහිත වන අවස්ථාවක ඒ නියමයන් කඩකිරීම නිසා හෝ එය ප්‍රතික්ෂේප කළ ලෙස සැලකීමට පාරිභෝගිකයන් විසින් තෝරාගැනීමෙන් ගිවිසුම අවසාන කරනු ලැබ ඇති වුවද එය එම යුක්ති සහගතභාවය පැවරීමේ අවශ්‍යතාව සපුරාලන බව තීරණය කොට එය බලසහිත කරනු ලැබිය හැකිය. 8(2) වගන්තියෙන් කියැවෙන්නේ ගිවිසුමක් එය ප්‍රතික්ෂේප කළ ලෙස සැලකීමට හිමිකම් ඇති තැනැත්තකු විසින් ස්ථිර කර ඇති අවස්ථාවක ඒ ස්ථිර කිරීමට යම් ගිවිසුම් නියමයක් සම්බන්ධයෙන් යුක්තිසහගත භාවය පැවතීමේ අවශ්‍යතාව බැහැර කරන්නක් ලෙස සලකනු නොලැබිය යුතු බවයි.

පනතේ 10(1) වගන්තියට අනුව යුක්ති සහගත භාවයේ අවශ්‍යතාව සපුරාලන තාක් දුරට පමණක් මේ පනත යටතේ බලාත්මක වන ගිවිසුම් නියමයක් ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී පාර්ශවකරුවන් දැනසිට හෝ සාධාරණව දැනසිටිය යුතු හෝ ඔවුන් විසින් අදහස් කර තිබූ අවස්ථානුගත කරුණුවලට සැලකිල්ල යොමුකළ ගිවිසුමට ඇතුලත් කිරීමට සාධාරණ සහ යුක්ති සහගත නියමයක් වේ නම් එම අවශ්‍යතාව සපුරාලනු ඇත.

පනතේ 10(4) වගන්තිය ඉතාම වැදගත් වන්නේ එමගින් කිසියම් ගිවිසුම් නියමයකට හෝ දැන්වීමකට යොමු කිරීමෙන් තැනැත්තෙකු ඔහුගේ වගකීම නිශ්චිත මුදල් ප්‍රමාණයකට සීමා කිරීමට අදහස් කරන විට එහිදී අනුගමනය කළ යුතු විධිවිධාන ගෙනහැර දක්වන හෙයිනි. එහි (අ) උපවගන්තියේ දැක්වෙන්නේ එවැනි විටෙක අදාළ නියමය හෝ දැන්වීම යුක්ති සහගතභාවය පැවතීමේ අවශ්‍යතාව ඉටු කරන්නේ ද යන ප්‍රශ්නය පැන නගින විට,

(අ) වගකීම ඇතිවුවහොත් එය ඉටු කිරීමේ කාර්යය සඳහා ඒ තැනැත්තාට ලබාගත හැකි යැයි බලාපොරොත්තු විය හැකි සම්පත්.
සහ
(ආ) ඒ තැනැත්තා රක්ෂණයෙන් ආවරණය ලබාගැනීමට කොතරම් දුරට ඉඩ තිබුණේද යන කාරණා පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතු බවයි.

10(5) වගන්තිය පවසන්නේ ගිවිසුම් නියමයන් හෝ දැන්වීමක් යුක්ති සහගතභාවයේ අවශ්‍යතාව සපුරාලන බව පෙන්වීම එය එසේ කියා සිටින පාර්ශවකරුගේ යුතුකම් වන බවයි.

මීට අමතරව කිසියම් ගිවිසුමක අඩංගු නියමයන් කොතෙක් දුරට යුක්ති සහගත වන්නේද යන්න පරීක්ෂා කිරීමේදී උපයෝගී කරගත යුතු මාර්ගෝපදේශ කිහිපයක් 1997 අංක 26 දරණ අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනතේ 2 වැනි උපලේඛනයේ දැක්වේ.

ඒ අතර පනතේ 7 වැනි වගන්තියේ කාර්යය සඳහා සැලකිල්ල යොමු කළ යුතු කරුණු ලෙස විශේෂයෙන් මෙහි සඳහන් කරුණු දැක්වේ.

01. (වෙනත් දේ අතර) ගණුදෙනුකරුගේ අවශ්‍යතා ඉටු කළ හැකිව තිබූ විකල්ප මාර්ග සැලකිල්ලට ගෙන පාර්ශවකරුවන්ගේ එකිනෙකාට සාපේක්ෂ කේවල් කිරීමේ තත්ත්ව වල ශක්තිය.

02. නියමයට එකඟ වීමට ගණුදෙනුකරුට පෙළඹවීමක් ලැබුණේද යන වග හෝ එය භාර ගැනීමේදී වෙනත් තැනැත්තන් සමග ඊට සමාන ගිවිසුමකට ඇතුලත්වීමේ අවස්ථාවක් එහෙත් සමාන නියමයක් භාරගැනීමට සිදුනොවී තිබුණේද යන වග.

03. (වෙනත් දේ අතර වෙළඳාමේ යම් සම්ප්‍රදායක් සහ පාර්ශවකරුවන් අතර ගණුදෙනු කිරීමේදී යම් පූර්ව ක්‍රියාවලියක් සැලකිල්ලට ගෙන) නියමයේ පැවැත්ම සහ එහි ප්‍රමාණය ගැන ගණුදෙනුකරු දැන සිටියේද නැතහොත් යුක්ති සහගත ලෙස දැනසිටියේද යන වග.

04. යම් කොන්දේසියකට අනුකූලව ක්‍රියාකර නොමැති නම් අදාළ වගකීම නියමයෙන් බැහැර කෙරෙන හෝ සීමා කෙරෙන අවස්ථාවක ඒ කොන්දේසියට අනුකූලව කටයුතු කිරීම බලාපොරොත්තු වීම, ප්‍රායෝගික ද යන්න ගිවිසුම ඇතිකර ගන්නා වේලාවේදී යුක්ති සහගත වන්නේ ද යන වග.

05. භාණ්ඩ පාරිභෝගිකයාගේ විශේෂ අණට ගැලපෙන පරිදි සාදනු ලැබුවේද, සකස් කරනු ලැබුවේද හෝ අනුගත කරන ලද්දේ ද යන වග.

මේ සියලු කරුණු සැලකිල්ලට ගෙන පරීක්ෂා කර බැලීමේදී කිසියම් ගිවිසුමක කිසියම් පාර්ශවයකට බලපාන ආකාරයේ අසාධාරණ නියමයන් අන්තර්ගතව පවතින්නේ යැයි හැඟෙන අවස්ථාවක ඊට එරෙහිව අධිකරණය ඉදිරියට යාමට හැකියාව ඇති බව පෙනේ.